ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - 2024

----

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 මතය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ("බැංකුව") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව,

- බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1. බැංකුවේ ණය වර්ගීකරණය සහ හානිකරණ ක්‍රියාවලීය සඳහා ඉහළ මට්ටම් විසින් අතින් සිදු කරන ගැලපීම් ඇතුළත් වන බව නිරීක්ෂණය විය. මෙම පරිචය ණය පහසුකම් නොගැලපෙන පරිදි හෝ පුද්ගලබද්ධව වර්ගීකරණය කිරීමේ අවදානම වැඩි කළ හැකි අතර අපේක්ෂිත ණය අලාභ (ECL) අඩුවෙන් දැක්වීමට හේතු විය හැක.	පද්ධති සීමාවන් නිසා සහ ඉහළ මට්ටමේ නිරවද්‍යතාවයක් පවත්වා ගැනීම සඳහා, ප්‍රතිඵලවල විශ්වසනීයත්වය සහතික කිරීමට අප විසින් අවශ්‍ය අතින් සිදු කරන ගැලපීම් සිදු කරයි.	අතින් සිදු කරන ගැලපීම් මත යැපීම අඩු කිරීම සඳහා හැකිතාක් දුරට, ණය වර්ගීකරණය සහ හානිකරණ ක්‍රියාවලින් ස්වයංක්‍රීය කිරීම.
2. ප්‍රතිමූල්‍යකරණ නොවන ණය පහසුකම්, මූලික බැංකු පද්ධතිය (CBS) තුළ ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස බැංකුව විසින් වැරදි ලෙස වර්ගීකරණය කර තිබුණි. මුලින් වාර්තා කළ නිෂ්පාදන වර්ගීකරණයන් සංශෝධනය කිරීමේ හැකියාව සීමා කරන පද්ධති සීමාවන් නිසා මෙම වැරදි වර්ගීකරණය සිදුවී තිබුණි. එබැවින්, බැංකුවේම අරමුදල් භාවිතා කර ප්‍රදානය කරන ලද ණය පහසුකම්, ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස වැරදි ලෙස වර්ගීකරණය කර තිබුණි. එබැවින්, මෙම වැරදි වර්ගීකරණය අපේක්ෂිත ණය අලාභ සැලකිය යුතු ලෙස අඩුවෙන් අස්තමේන්තු කිරීමට හේතු විය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය.	CBS තුළ නිෂ්පාදන වර්ගීකරණය වෙනස් කිරීමේදී පද්ධති සීමාවන් හේතුවෙන්, ඇතැම් ප්‍රතිමූල්‍යකරණය නොවන ණය පහසුකම් වැරදි ලෙස ප්‍රතිමූල්‍යකරණ පහසුකම් ලෙස වර්ගීකරණය කර ඇති අතර, එමඟින් අපේක්ෂිත ණය අලාභය අඩුවෙන් දැක්වීමට හේතු විය හැක. මෙය අවම කිරීම සඳහා, හානිකරණ ගණනය කිරීමේදී එවැනි ණය පහසුකම් අතින් හඳුනාගෙන ගැලපීම් කිරීමට පියවර ගෙන ඇත.	නිවැරදි නිෂ්පාදන වර්ගීකරණයට ඉඩ සැලසීමට සහ අනාගතයේදී ණය පහසුකම් වැරදි ලෙස වර්ගීකරණය කිරීම වැළැක්වීම සඳහා පද්ධති ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම.

1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 16) 51 වන ඡේදයට අනුව, "වත්කමෙහි සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාව පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් වන්නේ නම්, වෙනස්කම් එල්.කේ.ඒ.එස් 08 ට	අනාගතයේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතාවයන්ට අනුකූල වීමට කටයුතු යොදා ඇත.	අදාළ ගිණුම්කරණ ප්‍රමිතිය අනුගමනය කළ යුතුය.

අනුකූලව ගිණුම්ගත කළ යුතුය". කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට තවමත් භාවිතයේ පවතින රු. 2,517,809,777 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි.

1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ආර්ථික සාධකය ගැලපීම (EFA) ගණනය කිරීම සිදු කිරීමේදී බැංකුව විසින් විවිධ නිෂ්පාදනවල ගුණාත්මක සාධක සඳහා නිවැරදි ලකුණු ලබා දී නොතිබුණු අතර අවශ්‍ය පසුකාලීන වෙනස්කම් සිදු කර නොතිබුණි. සියලුම ගුණාත්මක සාධක සඳහා '1' ලකුණු ලබා දී තිබූ අතර එය සියලුම ණය වර්ග සඳහා ද අදාළ වේ. තවද, වර්ෂයෙන් වර්ෂය ලකුණු වෙනස් කර නොතිබූ අතර EFA සඳහා බලපෑම වඩා හොඳින් පිළිබිඹු වන පරිදි ගැලපීම් කර නොතිබුණි.	අවශ්‍යතාවයන්ට අනුව EFA සඳහා අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා සහාය වීමට බැංකුව විසින් ආකෘති වලංගුකරණ උපදේශකවරයකු යොදවා ඇත. 2025 සැප්තැම්බර් 30 වන දින සිට ගණනය කිරීමේදී මෙම නිවැරදි කිරීම් ක්‍රියාත්මක කරනු ඇත.	EFA නිසි ලෙස ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු තක්සේරු කිරීම්වලට අනුව, 2024 දෙසැම්බර් 31 වන දිනට රු. බිලියන 6 කට අධික බදු සහ දඩ ගෙවීම් තිබුණි.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද තීරණයන් මත පදනම්ව, 2017/18 සහ 2019/20 තක්සේරු වර්ෂයන්ට අදාළ ආයතනික ආදායම් බදු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් බදු වියදම් යටතේ රු. 212,281,393/- ක අතිරේක ප්‍රතිපාදනයක් සිදු කර ඇත.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලබන පරිදි නිවැරදි බදු මුදල ගෙවීමට කටයුතු කළ යුතුය.
2.	මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 වර්ෂය සඳහා වාර්ෂික මෙහෙයුම් ලාභ මත ප්‍රසාද දීමනාව ගෙවීම සඳහා ප්‍රතිපාදන කර තිබූ ගෙවිය යුතු වාර්ෂික මෙහෙයුම් ලාභය මත ප්‍රසාද දීමනාව - පොදු ලේජර අංක 225100140 හි රු. 174,418,972 ක ඉදිරියට ගෙන එන ගෙවිය යුතු ශේෂයක් පැවතුනු බව නිරීක්ෂණය විය. අධ්‍යක්ෂක මණ්ඩලය ඉහත ප්‍රසාද දීමනාව ගෙවීම අනුමත කර නොමැති බව නිරීක්ෂණය විය.	කළමනාකරණ තීරණයට යටත්ව පොදු ලේජර අංක 225100140 ට අදාළ ප්‍රතිපාදන මුදල නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.	මණ්ඩලය විසින් අනුමත නොකිරීම හේතුවෙන් සේවකයින් සඳහා ප්‍රසාද දීමනා ගෙවීමට කිසිදු වගකීමක් නොතිබූ බැවින්, ගෙවිය යුතු ශේෂය නිරවුල් කිරීමට පියවර ගත යුතුය.

1.6.2 අත්තිකාරම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1.	ප්‍රසම්පාදන අත්තිකාරම් ගෙවීම් 06 කට අදාළව රු. 9,187,768 ක මුදලක් නිරවුල් කිරීමෙන් තොරව වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ ගිණුම්වල පවතී. මෙම ගැටළුව 2018 වර්ෂයේ සිට විගණන විමසුම් හරහා අඛණ්ඩව වාර්තා කර ඇත. කෙසේ වෙතත්, කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර, ශේෂයන් නොවෙනස්ව පවතී.	එක් ප්‍රසම්පාදනයක් අවසන් කර ඇති අතර අත්තිකාරම් ගෙවීම් වත්කම් ගිණුමට මාරු කර ඇත. අනෙකුත් ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කරමින් පවතී.	අදාළ ප්‍රසම්පාදනය අවසන් කර, දිගු කාලීන හිඟ අත්තිකාරම් ගෙවීම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
2.	ණය පැහැර හැරීමේ අවදානම අවම කිරීම සඳහා ණය සහ අත්තිකාරම් ලබා දීමේදී ප්‍රමාණවත් සුරැකුම්පත් ලබා ගැනීම අවශ්‍ය වේ. 2024 දෙසැම්බර් 31 වන දිනට ණය ප්‍රධාන ගොනුවට අනුව, බැංකුවේ මුළු ණය කළඹෙහි රු. 183,670,036,607 ක සමස්ත හිඟ ශේෂයක් වාර්තා විය. මෙයින් එකතුව රු. 1,485,985,522 ක් වූ හිඟ ණය බැංකුවේ ඉහළම අක්‍රිය ගනුදෙනුකරුවන් 25 දෙනාට අයත් වේ. ඉහළම අක්‍රිය ගනුදෙනුකරුවන් 25 දෙනාට අදාළ මුළු ණය හිඟ ශේෂයෙන් රු. 655,653,042 ක් හෙවත් සියයට 44 ක් නිශ්චල දේපළවලට එරෙහිව සුරක්ෂිත කර නොමැති බව . තවදුරටත් සිදු කරන ලද සමාලෝචනයෙන් හෙළිදරව් විය. පවතින සුරැකුම්පත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, මෙම මුදල අයකර ගැනීමේ හැකියාව සැක සහිත බව සලකනු ලැබේ.	කළමනාකරණ අදහස් දැක්වීම් ලැබී නොමැත.	ණය ආපසු අයකර ගැනීමේ හැකියාව ආරක්ෂා කර ගැනීමට සහ ණය පැහැර හැරීමේ අවදානම අවම කිරීමට ණය සහ අත්තිකාරම් සඳහා ප්‍රමාණවත් සහ නිසි සුරැකුම්පත් ලබා ගැනීම සහතික කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව			අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1.	බැංකු පනතේ නියෝග				
	i. 2011 ඔක්තෝබර් 05 දිනැති 2011 අංක 7				
	අ)	මාර්ගෝපදේශ බී හි 1.2(ජී) නියෝගය	සෑම ණයගැතියෙකුටම සහ පහසුකමකටම අවදානම් ශ්‍රේණිගත කිරීමේ අවශ්‍යතාවය ණය අවදානම් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, සෑම ණයගැතියෙකුටම සහ ණය පහසුකමකටම අවදානම් ශ්‍රේණිගත කිරීමක් පැවරීමේ අවශ්‍යතාවයට බැංකුව අනුකූල නොවන බව නිරීක්ෂණය විය. වර්තමානයේ, නිශ්චල දේපල මගින් සුරක්ෂිත කර ඇති රු. මිලියන 5 ඉක්මවන ණය පහසුකම් ඇති ගනුදෙනුකරුවන්ට සහ පුද්ගලික ඇපකර හෝ වෙනත් උකස් මගින් සුරක්ෂිත කර ඇති රු. මිලියන 3.50 ඉක්මවන පහසුකම් ඇති ගනුදෙනුකරුවන්ට පමණක් අවදානම් ශ්‍රේණිගත කිරීම් පවරනු ලබයි.	මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC*)* නිර්දේශය මත අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, 2025 දෙසැම්බර් 31 වන දින වන විට ණය ප්‍රභව පද්ධතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමත් සමඟ මෙම ගැටළුව නිවැරදි කරනු ඇත.	ණය අවදානම් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සියලුම ණයගැතියන් සහ ණය පහසුකම් සඳහා අවදානම් ශ්‍රේණිගත කිරීමක් පවරා ඇති බව සහතික කිරීමට කටයුතු කළ යුතුය.
	ආ)	මාර්ගෝපදේශ බී හි 2.5(බී) නියෝගය	විවිධ කර්මාන්ත, ව්‍යාපාර සහ පුද්ගලික අංශවල ණය ගැතියන්ගේ ශ්‍රේණිගත කිරීම අනුව ව්‍යාප්තිය ඇගයීමට බැංකුව සලකා බැලිය යුතුය. විවිධ කර්මාන්ත, ව්‍යාපාර සහ පුද්ගලික අංශවල ණය ගැතියන්ගේ ශ්‍රේණිගත කිරීම අනුව ව්‍යාප්තිය ඇගයීමට බැංකුව යාන්ත්‍රණයක් ස්ථාපිත කර නොතිබුණි. මෙය පරීක්ෂා නොකළ කළඹ සංකේන්ද්‍රණය, සාවද්‍ය අවදානම් තක්සේරු කිරීම් සහ ඵලදායී නොවන ණය අවදානම් කළමනාකරණ පරිචයන්ට හේතු විය හැක.	ණය ගැණුම්කරුවන්ගේ ශ්‍රේණිගත කිරීම දැනටමත් LOS පද්ධතියට ඇතුළත් කර ඇත. එබැවින්, 2025 දෙසැම්බර් 31 වන දින වන විට ණය ප්‍රභව පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීම සමඟ මෙම ගැටළුව නිවැරදි කරනු ඇත.	සියලුම ණය ගැති ශ්‍රේණිගත කිරීම් නිසි ලෙස සටහන් කර ඇති බව සහතික කිරීම සඳහා ණය ප්‍රභව පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.

ii. 2014 ජුනි 26 දිනැති 2014 අංක 14

අ)	4.2 නියෝගය - තොරතුරු ආරක්ෂණ කළමනාකරණ මාර්ගෝපදේශය සඳහා මූලික ප්‍රමිතිය - II	තොරතුරු හැසිරවීමේදී අවශ්‍යතාවය, ප්‍රමුඛතා සහ අපේක්ෂිත ආරක්ෂණ මට්ටම දැක්වීමට තොරතුරු වර්ගීකරණය සිදු කළ යුතු වත්කම් හිමිකරුට සහාය වීම සඳහා බැංකුවේ තොරතුරු වර්ගීකරණ මාර්ගෝපදේශය, තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති ලේඛනයේ ප්‍රකාශයට පත් කළ යුතුය. තොරතුරු ලේබල් කිරීම සඳහා සුදුසු ක්‍රියා පටිපාටි මාලාවක් සංවර්ධනය කර ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වෙතත්, දත්ත සහ තොරතුරු ඒවායේ රහස්‍යතා මට්ටම මත පදනම්ව වර්ගීකරණය කිරීම සඳහා බැංකුව විසින් විස්තීර්ණ බැංකු-ව්‍යාප්ත තොරතුරු වර්ගීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කර නොමැති බව නිරීක්ෂණය විය. තොරතුරු වර්ගීකරණය සඳහා බැංකුව විසින් තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කර ඇතත්, ඉලෙක්ට්‍රොනිකව නඩත්තු කරන ලද ලිපිගොනු/ලේඛන ලේබල් නොකිරීම හේතුවෙන් ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.	තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය ISO 27000:2022 ප්‍රමිතියට අනුකූලව සමාලෝචනය කර ඇත. තොරතුරු වර්ගීකරණ ප්‍රතිපත්තිය පිළියෙල කර ඇති අතර එය අනුමැතිය සඳහා BIRMC වෙත සහ පසුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත. පැවරුම 2025 නොවැම්බර් 30 වන දින වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.	නියෝගයට අනුකූලවීමට කටයුතු කළ යුතුය.
ආ)	6.15 නියෝගය - තොරතුරු ආරක්ෂණ කළමනාකරණ මාර්ගෝපදේශය සඳහා මූලික ප්‍රමිතිය - II	පරිපාලක, ක්‍රියාකරු සහ දෝෂ ලොග් සමාලෝචනය කිරීම සඳහා පද්ධති අධීක්ෂණය කළ යුතු අතර තොරතුරු ආරක්ෂක සිදුවීම් වාර්තා කළ යුතුය. තොරතුරු පද්ධති ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම සහතික කිරීම සඳහා මෙම ලොග් භාවිතා කළ යුතුය. විභව ආරක්ෂක ගැටළු හඳුනා ගැනීමට පද්ධති ලොග් සමාලෝචනය කිරීම සඳහා බැංකුවට ඵලදායී ක්‍රියා පටිපාටියක් නොමැති බව නිරීක්ෂණය විය. ලොග්	පැය 24 පුරා ක්‍රියාත්මක ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථාන (SOC) ලොග් අධීක්ෂණ පහසුකමක් බාහිරින් ලබා ගන්නා සේවාවක් ලෙස මෙහෙයවීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනට සිදුකරමින් පවතී. මෙම පහසුකම ක්‍රියාත්මක කිරීම 2025 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.	නියෝගයට අනුකූලවීමට කටයුතු කළ යුතුය.

	විශ්ලේෂක පද්ධතියක් නොමැතිකම, එහි තොරතුරු තාක්ෂණ පරිසරය පුරා අසාමාන්‍ය හෝ අනවසර ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීමට, හඳුනා ගැනීමට සහ ප්‍රතිචාර දැක්වීමට බැංකුවට ඇති හැකියාව සැලකිය යුතු ලෙස සීමා කරයි.		
ඇ) 13.10 නියෝගය - තොරතුරු ආරක්ෂණ කළමනාකරණ මාර්ගෝපදේශය සඳහා මූලික ප්‍රමිතිය - II	තොරතුරු කාන්දුවීමේ හැකියාව සෑම විටම වළක්වා ගත යුතුය. සංවේදී සහ රහස්‍ය තොරතුරු බෙදා හැරීම හෝ සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අවශ්‍ය තීරණාත්මක පාලනයක් වන තොරතුරු කාන්දුවීම වැළැක්වීමේ පද්ධතියක් බැංකුව විසින් ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.	තොරතුරු වර්ගීකරණ ප්‍රතිපත්තිය පිළියෙල කර ඇති අතර ඒ සඳහා BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටින අතර එය 2025 නොවැම්බර් 30 වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.	රහස්‍ය තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා තොරතුරු කාන්දුවීම වැළැක්වීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
iii. 2021 ජුනි 16 දිනැති 2021 අංක 09			
8.2 නියෝගය	රු. ට්‍රිලියන 1 ට අඩු වත්කම් ඇති බලපත්‍රලාභී බැංකු 2022 ජුනි 30 වන දින සිට ප්‍රතිසාධන සැලැස්මක් පවත්වාගෙන යා යුතු අතර එවැනි සැලසුම් අදාළ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණයේදී සමාලෝචනයට ලක් කරනු ඇත. කෙසේ වෙතත්, අවශ්‍ය පරිදි ප්‍රතිසාධන සැලැස්මක් ස්ථාපිත කර පවත්වාගෙන යාමට බැංකුව අපොහොසත් වී ඇති බවත්, ව්‍යවස්ථාපිත පරීක්ෂණයේදී සමාලෝචනය සඳහා එවැනි සැලැස්මක් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත් නිරීක්ෂණය විය. අනුමත සහ යාවත්කාලීන ප්‍රතිසාධන සැලැස්මක් නොමැතිකම ප්‍රමාද වූ ප්‍රතිසාධන ක්‍රියාමාර්ගවල සහ මෙහෙයුම්වල විභව අස්ථාවරත්වයේ අවදානම වැඩි කරයි.	අනුමත වර්ධන (Augmentation) සැලැස්මට අනුකූලව බැංකුවේ පවතින ප්‍රතිසාධන සැලැස්ම දැනට යාවත්කාලීන කරමින් පවතී. යාවත්කාලීන කරන ලද ප්‍රතිසාධන සැලැස්ම ඊළඟ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට එහි නිර්දේශ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අතර පසුව අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත.	අනුමත වර්ධන සැලැස්ම සමඟ අනුකූලතාවය සහතික කිරීම සඳහා යාවත්කාලීන කරන ලද ප්‍රතිසාධන සැලැස්ම අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

	iv. 2021 සැප්තැම්බර් 14 දිනැති 2021 අංක 13			
අ)	4.2.5 නියෝගය	බලපත්‍රලාභී බැංකුවේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ මැනීම සඳහා භාවිතා කරන ආකෘති සම්බන්ධයෙන්, පැහැදිලි භූමිකාවන් සහ වගකීම්, වලංගුකරණ වාර ගණන සහ බැංකුව විසින් භාවිතා කළ යුතු ක්‍රියා පටිපාටි සහ ක්‍රමවේද ඇතුළුව, ණය ප්‍රතිපත්තියට විස්තීර්ණ වලංගුකරණ ප්‍රතිපත්තියක් ඇතුළත් බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත ප්‍රතිපත්තිය ස්ථාපිත කිරීමට බැංකුව අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.	ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම සඳහා භාවිතා කරන ආකෘති සඳහා වලංගුකරණ ප්‍රතිපත්තියක් ඇතුළත් ණය ප්‍රතිපත්තිය, 2025 ජූනි 5 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එම දිනයේ සිට ක්‍රියාත්මක වේ.	ඵලදායී ණය අවදානම් කළමනාකරණය පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය ප්‍රතිපත්ති කාලීනව ක්‍රියාත්මක කිරීම සහ අඛණ්ඩ සමාලෝචනය සහතික කිරීම.
ආ)	4.4 නියෝගය	බලපත්‍රලාභී විශේෂිත බැංකු, තම බැංකුව විසින් කිසියම් ණය ගැණුම්කරුවෙකුට ලබා දී ඇති කිසියම් ණය පහසුකමක් අයකර ගැනීමට අරමුදල් නොයෙදවිය යුතුය. කෙසේ වෙතත්, නව ණය නිකුත් කිරීමෙන් ණය අයකර ගැනීම සඳහා බැංකුව අරමුදල් යොදවා ඇති බව නිරීක්ෂණය විය. උදා: අවිස්සාවේල්ල සහ මාවරමණ්ඩිය ශාඛා.	එවැනි ගනුදෙනු වළක්වා ගැනීම සඳහා අදාළ ශාඛාවලට උපදෙස් ලබා දෙන ලදි.	රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීමට සහ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය.
ඇ)	10.1.2 සහ 10.1.3 නියෝගය	එස්.එල්.එෆ්,ආර්.එස් 09 යටතේ උසස් කරන ලද ණය පහසුකම් හැර දෙගුණයක් දක්වා ප්‍රතිව්‍යුහගත කරන ලද ණය පහසුකම් අදියර 2 ලෙස වර්ගීකරණය කළ යුතු අතර උසස් කරන ලද ණය පහසුකම් හැර දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කරන ලද ණය පහසුකම් අදියර 3 ලෙස වර්ගීකරණය කළ යුතුය. කෙසේ වෙතත්, ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කර ඇති වාර ගණන නිවැරදිව හඳුනා ගැනීම සඳහා යාන්ත්‍රණයක් බැංකුව විසින් ස්ථාපිත කර නොමැති බවත්, ඒ	මූලික බැංකු පද්ධතියට දැනට යාන්ත්‍රණයක් නොමැති බැවින්, තොරතුරු අතින් එකතු කර මාසිකව සමාලෝචනය කරයි. 2025 සැප්තැම්බර් මාසයේ හානිකරණ ගණනය කිරීම මගින් මෙය සම්පූර්ණයෙන්ම නිවැරදි කරනු ඇත.	අපේක්ෂිත ණය අලාභ නිවැරදි වර්ගීකරණය සහ නිවැරදි ගණනය කිරීම සහතික කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම් නිරීක්ෂණය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

		අනුව ඒවා වර්ගීකරණය කිරීමට අපොහොසත් වී ඇති බවත් නිරීක්ෂණය විය. වැරදි ස්ථානගත කිරීම අපේක්ෂිත ණය අලාභ (ECL) අඩුවෙන් දැක්වීමට හේතු විය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය.		
ඇ)	11.1.1 නියෝගය	ණය පහසුකම් උසස් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියකට අනුකූලව සිදු කළ යුතු අතර, එවැනි උසස් කිරීම සඳහා හේතු නිසි ලෙස ලේඛනගත කළ යුතුය. එවැනි ප්‍රතිපත්තියක් මගින් අවම වශයෙන් අනාගත ණය බැඳීම් අපේක්ෂා කළ හැකි අනාගත කාලයක් දක්වා ගෙවීමට ගනුදෙනුකරුගේ හැකියාව පිළිබඳව බැංකුව සෑහීමකට පත්වන බව සහතික කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතාවයට අනුකූල වීම සත්‍යාපනය කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව බැංකුව ණය පහසුකම් උසස් කර ඇති බව නිරීක්ෂණය විය.	අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උසස් කිරීමේ ප්‍රතිපත්තියට අනුව ප්‍රතිලේඛණගත කරන ලද ණය උසස් කරයි. අනාගත ණය බැඳීම් ගෙවීමම සඳහා ගනුදෙනුකරුවන්ගේ හැකියාව පිළිබඳ විෂය මූලික සාක්ෂි බැංකුව ප්‍රමාණවත් ලෙස සලකාබලා නොමැත. මෙම පරතරය පියවීම සඳහා බැංකුව සිය ප්‍රතිපත්තිය සමාලෝචනය කරමින් සිටී.	නියෝගවලට අනුකූලවීමට කටයුතු කළ යුතුය.
v. 2021 දෙසැම්බර් 09 දිනැති 2021 අංක 16				
අ)	4.1.2 නියෝගය	බලපත්‍රලාභී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරියා නොමැති විට තොරතුරු ආරක්ෂක කමිටුවේ (ISC) රැස්වීම්වල මුලසුන දැරීම සඳහා නියෝජ්‍ය සභාපතිවරුන් එක් අයෙකු හෝ කිහිප දෙනෙකු පත් කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ISC සඳහා කිසිදු නියෝජ්‍ය සභාපතිවරයෙකු පත් කර නොමැති බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ආ)	4.1.6 නියෝගය	තොරතුරු ආරක්ෂක කමිටුව (ISC) මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	තොරතුරු ආරක්ෂක කමිටුව විසින්

		(BIRMC) හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතු අතර අවම වශයෙන් කාර්තුමය පදනමක් මත එහි කටයුතු පිළිබඳව BIRMC වෙත දැනුම් දිය යුතුය. කෙසේ වෙතත්, බැංකුවේ ISC එවැනි කාර්තුමය වාර්තා BIRMC වෙත ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.		BIRMC වෙත කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීම සහතික කිරීමට කටයුතු කළ යුතුය.
ඇ)	4.1.7 නියෝගය	තොරතුරු ආරක්ෂක කමිටුව (ISC) අවම වශයෙන් සෑම මාස දෙකකට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වෙතත්, බැංකුව මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොමැති බව නිරීක්ෂණය වූ අතර, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී අවශ්‍ය අවම රැස්වීම් 06 වෙනුවට ISC රැස්වීම් 03 ක් පමණක් පවත්වා ඇත. මෙය තොරතුරු ආරක්ෂක කරුණු ප්‍රමාණවත් ලෙස අධීක්ෂණය කිරීමට සහ කාලීනව විසඳීමට කමිටුවට ඇති හැකියාව අඩාල කළ හැකිය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	තොරතුරු ආරක්ෂණ කරුණු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා අවම වශයෙන් සෑම මාස දෙකකට වරක්වත් තොරතුරු ආරක්ෂක කමිටුව රැස්වන බව සහතික කිරීමට කටයුතු කළ යුතුය.
ඈ)	4.2.1 සහ 4.2.2 නියෝගය	බලපත්‍රලාභී බැංකු විසින් බලපත්‍රලාභී බැංකුවේ තොරතුරු ආරක්ෂාව සඳහා වගකිව යුතු විධායක නිලධාරියා ලෙස ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (CISO) පත් කළ යුතුය. එසේම, CISO බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙකු විය යුතු අතර බලපත්‍රලාභී බැංකුවේ සංවිධාන ව්‍යුහයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ මට්ටමට පහළින් ආසන්න ස්ථර දෙක තුළ සිටිය යුතුය. කෙසේ වෙතත්, අවශ්‍ය පරිදි බැංකුව විසින් CISO පත් කර නොමැති බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	අනුකූලතාව සහතික කිරීම සහ තොරතුරු ආරක්ෂණ පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් සුදුසුකම් ලත් ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියකු පත් කිරීමට කටයුතු කළ යුතුය.

ඉ)	4.6.5 නියෝගය	ගෙවීම් කාඩ්පත් සහ ඉලෙක්ට්‍රොනික බැංකුකරණය වැනි තාක්ෂණය මත පදනම් වූ බැංකු නිෂ්පාදන සහ සේවාවන් සඳහා ව්‍යාපාරික ඒකක වගකිව යුතු බව බලපත්‍රලාභී බැංකු සහතික කළ යුතු අතර තොරතුරු තාක්ෂණය සහ තොරතුරු ආරක්ෂාව ආශ්‍රිත සේවා සැපයීමේ කාර්යයන්, අවදානම් කළමනාකරණ කාර්යය මගින් ක්‍රියාත්මක කර අධීක්ෂණය කරනු ලබන කාර්තුමය අවදානම් සහ පාලන ස්වයං තක්සේරු (RCSA) ක්‍රියාවලියට යටත් වේ. කෙසේ වෙතත්, බැංකුව මෙම නියෝගය ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නිසි අවදානම් අධීක්ෂණය සහ අනුකූලතාවය සහතික කිරීම සඳහා කාර්තුමය පදනමක් මත අවදානම් සහ පාලන ස්වයං තක්සේරු ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
ඊ)	4.6.6 නියෝගය	බලපත්‍රලාභී බැංකුවේ BIRMC විසින් අනුමත කරන ලද තෙවන පාර්ශවීය සේවා සපයන්නන් සහ නියෝජිතයින් විසින් සිදු කරනු ලබන සේවාවන්හි තීරණාත්මකභාවය සහ සංවේදීතාවයට අනුරූප වන, තෙවන පාර්ශවීය සේවා සපයන්නන් සහ නියෝජිතයින් සඳහා අවදානම් සහ පාලන ස්වයං තක්සේරු ක්‍රියාවලීන් ඇතුළුව ප්‍රමාණවත් තාක්‍ෂණික අවදානම් කළමනාකරණය සහ අධීක්ෂණ පියවරයන් බලපත්‍රලාභී බැංකු විසින් ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව විසින් BIRMC අනුමත අවදානම් සහ පාලන ස්වයං තක්සේරු ක්‍රියාවලීන් හෝ එහි තෙවන පාර්ශවීය සේවා සපයන්නන් සහ නියෝජිතයින් (සිටීනම්) සඳහා ප්‍රමාණවත් අධීක්ෂණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය. මෙම අනුකූල නොවීම බාහිරින් ලබාගත් ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීමේ අවදානම වැඩි කරන බවත්, එමඟින් බැංකුව මෙහෙයුම්, අනුකූලතා සහ තොරතුරු	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

		ආරක්ෂණ අවදානම්වලට නිරාවරණය විය හැකි බවත් තවදුරටත් නිරීක්ෂණය විය.		
එ)	4.7.1 නියෝගය	බලපත්‍රලාභී බැංකු මෙම නියාමන රාමුවේ සහ තොරතුරු ආරක්ෂාව සහ තාක්ෂණ අවදානම් කළමනාකරණයට අදාළ අනෙකුත් මහ බැංකු රෙගුලාවල අවශ්‍යතාවලට අනුකූල වීම බලපත්‍රලාභී බැංකු විසින් සහතික කළ යුතු අතර, අභ්‍යන්තර විගණන අංශය විසින් අවම වශයෙන් වාර්ෂිකව එවැනි අනුකූලතාවයක් පරීක්ෂා කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් තොරතුරු ආරක්ෂාව පිළිබඳ මහ බැංකු රෙගුලාසිවලට අනුකූල වීම සම්බන්ධයෙන් එවැනි තක්සේරුවක් සිදු කර තිබූ බවට විගණනයේදී සාක්ෂි නොලැබුණි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	මහ බැංකු රෙගුලාසිවලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් වාර්ෂික තක්සේරු කිරීම් සිදු කරන බවට සහතික වීම.
ඒ)	5.1.1 නියෝගය	බලපත්‍රලාභී බැංකු විසින් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා තොරතුරු ආරක්ෂාව සහ තාක්ෂණ අවදානම් කළමනාකරණය පිළිබඳ සවිස්තරාත්මක වාර්ෂික පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. එවැනි පුහුණුවක් අවම වශයෙන් වාර්ෂික ව්‍යුහගත පුහුණු වැඩසටහනකින් සහ සෑම වසරකම තොරතුරු ආරක්ෂාව සහ තාක්ෂණ අවදානම් කළමනාකරණය පිළිබඳ විශේෂඥයින් විසින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ සැසි එකක් හෝ කිහිපයක් ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, බැංකුව තම අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා එවැනි පුහුණු හෝ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා නොමැති බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	අවශ්‍ය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා තොරතුරු ආරක්ෂාව සහ තාක්ෂණ අවදානම් කළමනාකරණය පිළිබඳ ව්‍යුහගත වාර්ෂික පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

එ)	5.1.2 නියෝගය	තීරණාත්මක තොරතුරු පද්ධති, ගණුදෙනුකරුවන්ගේ දත්ත හෝ රහස්‍ය ගණුදෙනුකරුවන්ගේ නොවන දත්තවලට නිරාවරණය වන හෝ ඒවාට නිරාවරණය විය හැකි බැංකුවේ කාර්ය මණ්ඩලය, නියෝජිතයින් සහ තෙවන පාර්ශවීය සේවා සපයන්නන් තොරතුරු ආරක්ෂාව පිළිබඳව පුහුණු කර සහතික කර ඇති බව බලපත්‍රලාභී බැංකු විසින් සහතික කළ යුතුය. තවද, තොරතුරු ආරක්ෂාව පිළිබඳ ප්‍රමාණවත් සහ සැසඳිය හැකි දැනුවත් කිරීමේ පියවරයන් එවැනි නියෝජිතයින් සහ තෙවන පාර්ශවීය සේවා සපයන්නන් විසින් එහි කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාත්මක කර ඇත්නම්, අධ්‍යක්ෂ මණ්ඩලයට නියෝජිතයින්ගේ සහ තෙවන පාර්ශවීය සේවා සපයන්නන්ගේ කාර්ය මණ්ඩලය මෙම අවශ්‍යතාවලින් බැහැර කළ හැකිය. කෙසේ වෙතත්, බැංකුව එහි සියලුම කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව සහ සහතිකය ලබා දී නොමැති බවත් නියෝජිතයින් සහ තෙවන පාර්ශවීය සේවා සපයන්නන් තොරතුරු ආරක්ෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුවත් කිරීමේ පියවරයන් ක්‍රියාත්මක කර ඇත්දැයි සත්‍යාපනය කර නොමැති බවත් නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ඒ)	5.2.2 නියෝගය	බලපත්‍රලාභී බැංකු විසින් වරප්‍රසාද ලත් පරිශීලකයින් ඇතුළුව සියලුම පරිශීලකයින් කළමනාකරණය කිරීම සඳහා කර්මාන්ත සම්මත පරිශීලක ප්‍රවේශ සහ අනන්‍යතා කළමනාකරණ පද්ධතියක්(පද්ධති) ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව එවැනි පද්ධතියක් ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය වූ අතර එමඟින් අනවසර ප්‍රවේශය, වරප්‍රසාද ලත්	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	කර්මාන්ත-සම්මත පරිශීලක ප්‍රවේශ සහ අනන්‍යතා කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

		ගිණුම් අනිසි ලෙස භාවිතා කිරීම සහ තීරණාත්මක තොරතුරු පද්ධති කෙරෙහි ප්‍රමාණවත් පාලනයක් නොමැති වීම වැනි අවදානම්වලට බැංකුව නිරාවරණය විය හැකිය.		
ඔ)	5.2.3 නියෝගය	වරප්‍රසාද ලත් පරිශීලක ප්‍රවේශය "තිබීමට අවශ්‍ය" පදනම මත පමණක් ලබා දිය යුතු අතර එවැනි ප්‍රවේශයක් අවශ්‍ය වූ විට සීමිත කාලයක් සඳහා පමණක් ඉහළම මට්ටමේ ප්‍රවේශය ලබා දිය යුතුය. කෙසේ වෙතත්, බැංකුව මෙම පාලනය ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය වූ අතර, එමඟින් මෙහෙයුම්, ආරක්ෂාව සහ දත්ත අඛණ්ඩතාව පිළිබඳ ගැටළු ඇති විය හැකි තීරණාත්මක පද්ධති වෙත අනවසර හෝ අධික ප්‍රවේශයක් ඇතිවීමේ අවදානම වැඩි කරයි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	වරප්රසාද ලත් පරිශීලක ප්‍රවේශය "තිබීමට අවශ්‍ය" පදනම මත සීමා කිරීමට කටයුතු කළ යුතුය.
ඕ)	5.2.4 නියෝගය	මූලික බැංකුකරණය සඳහා බලපත්‍රලාභී බැංකු විසින් අවම වශයෙන් කාර්තුමය පදනමක් මත තීරණාත්මක තොරතුරු පද්ධති සඳහා පරිශීලක ප්‍රවේශ වරප්‍රසාද සමාලෝචන පැවැත්විය යුතු අතර, ගණුදෙනුකරුවන්ගේ දත්ත සහ රහස්‍ය ගණුදෙනුකරුවන්ගේ නොවන දත්තවලට නිරාවරණය වන තීරණාත්මක නොවන තොරතුරු පද්ධති සඳහා අවම වශයෙන් ද්වි-වාර්ෂික පදනමක් මත සහ අනෙකුත් සියලුම තොරතුරු පද්ධති සඳහා අවම වශයෙන් වාර්ෂික පදනමක් මත එම සමාලෝචන පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, බැංකුව විසින් තීරණාත්මක තොරතුරු පද්ධති 12 ක් (මූලික බැංකුකරණය පද්ධතිය හැර) සහ තීරණාත්මක නොවන තොරතුරු පද්ධති 09 ක් සඳහා වාර්ෂික පදනමක් මත පමණක් පරිශීලක ප්‍රවේශ වරප්‍රසාද සමාලෝචන පවත්වා ඇති බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නිසි ප්‍රවේශ පාලනය සහතික කිරීම සඳහා අවශ්‍ය පරිදි පරිශීලක ප්‍රවේශ වරප්‍රසාද සමාලෝචන පැවැත්වීමට කටයුතු කළ යුතුය.

ක)	5.4.1 නියෝගය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු වර්ගීකරණ ප්‍රතිපත්තියකට අනුව, ඉලෙක්ට්‍රොනිකව නඩත්තු කරන ලද සියලුම දත්ත තොරතුරු ආරක්ෂණ සංවේදීතාව මත පදනම්ව වර්ගීකරණය කිරීම සහ පවරා ඇති වර්ගීකරණයක් සමඟ ලේබල් කිරීම කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව මෙම උපදෙස්වලට අනුකූල වී නොමැති බවත්, තවමත් තොරතුරු වර්ගීකරණ ප්‍රතිපත්තිය අවසන් කර නොමැති බවත් නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ඛ)	5.5.1 නියෝගය	මෙම නියෝගය මගින් නිර්දේශ කර ඇති පරිදි ගණුදෙනුකරුවන්ගේ දත්ත සාමාන්‍යයෙන් සංකේතනය භාවිතයෙන් ආරක්ෂා කළ යුතුය. බලපත්‍රලාභී බැංකුව, නියෝජිතයන් සහ තෙවන පාර්ශවීය සේවා සපයන්නන් සමඟ පවත්වාගෙන යනු ලබන ගණුදෙනුකරුවන්ගේ දත්ත සඳහා මෙම අවශ්‍යතාවය අදාළ වේ. කෙසේ වෙතත්, බැංකුවේ සංකේතන ඇල්ගොරිතමය තවමත් මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අනුමත කර නොමැති බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

ග)	5.6.1 සහ 5.6.7(iii) නියෝගය	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (උදා: අන්තර්ජාල බැංකුකරණය, ජංගම යෙදුම්, ගණුදෙනුකරු/තෙවන පාර්ශවීය ඒකාබද්ධ කිරීම් ආදිය) හැර අනෙකුත් ඉලෙක්ට්‍රොනික බෙදාහැරීමේ නාලිකා පිරිනමන සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් මෙම නියාමන රාමුවේ අවශ්‍යතා අනුව ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කළ යුතුය. අතිරේකව, සියලුම බලපත්‍රලාභී බැංකු සඳහා දත්ත නැතිවීම වැළැක්වීමේ (DLP) මෙවලමක් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය වේ. කෙසේ වෙතත්, බැංකුව ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් හෝ දත්ත නැතිවීම වැළැක්වීමේ මෙවලමක් ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ච)	5.7.1 නියෝගය	බලපත්‍රලාභී බැංකුවලට යාවත්කාලීන සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සිදුවීම් ප්‍රතිචාර සැලැස්මක් (IRP) තිබිය යුතු අතර, සිදුවීම් උත්සන්නකරණය (Incident escalation), ප්‍රතිකර්ම, ප්‍රතිසාධනය සහ අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය සඳහා වන ක්‍රියා පටිපාටි විස්තර කර යුතුය. සයිබර් ආරක්ෂණ සිදුවීම් ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී, සාමාන්‍යයෙන් හඳුනාගත් තොරතුරු ආරක්ෂණ සිදුවීම් වර්ග සමඟ කටයුතු කිරීම සඳහා IRP හි නිශ්චිත ක්‍රියා පටිපාටි ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, සිදුවීම් ප්‍රතිචාර සැලැස්ම තවමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැති බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ජ)	6.2.2 සහ 6.2.3 නියෝගය	මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) නිර්දේශය මත, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක්	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

		එක් තීරණාත්මක තොරතුරු පද්ධතිය සඳහා උපයෝජ්‍යතා ඉලක්ක ස්ථාපිත කළ යුතුය. එසේම, තීරණාත්මක තොරතුරු පද්ධතිවල පද්ධති උපයෝජ්‍යතා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අධීක්ෂණය කර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන බව BIRMC විසින් සහතික කළ යුතුය. කෙසේ වෙතත්, මෙම නියෝගය අනුව BIRMC විසින් පද්ධති උපයෝජ්‍යතා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අධීක්ෂණය කර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර නොමැති බව නිරීක්ෂණය විය.		
ට)	7 නියෝගය	බලපත්‍රලාභී බැංකු විසින් තොරතුරු ආරක්ෂාව, තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර විගණන කාර්යයන් සඳහා යෝග්‍ය සුදුසුකම් සහිත අවම කාර්ය මණ්ඩලයක් අවශ්‍ය පරිදි සේවයේ යොදවා ඇති බව සහතික කළ යුතුය. ඒ අනුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට කළමනාකරණ සහ විධායක මට්ටමින් සුදුසුකම් ලත් නිලධාරීන් 08 දෙනෙකු සිටිය යුතුය. කෙසේ වෙතත්, බැංකුවේ සුදුසුකම් ලත් එක් නිලධාරියෙකු පමණක් සේවයේ යොදවා ඇත.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුව අදාළ කාර්යයන් සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය යෙදවීම.
ඩ)	8 නියෝගය	බලපත්‍රලාභී බැංකුවක් විසින් ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංවිධානය මගින් නිකුත් කරන ලද පහත සඳහන් අනිවාර්ය ISO ප්‍රමිතීන් ක්‍රියාත්මක කළ යුතු අතර පහත දක්වා ඇති පරිදි සහතිකය හෝ සහතික කිරීම ලබා ගත යුතුය. • ISO/IEC 27001 හි නවතම සංස්කරණය • ISO/IEC 27035 හි නවතම සංස්කරණය • ISO/IEC 22301 හි නවතම සංස්කරණය • ISO/IEC 20000 හි නවතම සංස්කරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	බැංකුවේ තොරතුරු ආරක්ෂාව සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා අනිවාර්ය ISO ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමට සහ සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

		කෙසේ වෙතත්, බැංකුව විසින් මෙම ප්‍රමිතීන් කිසිවක් ක්‍රියාත්මක කර සහතික ලබාගෙන නොමැති බව නිරීක්ෂණය විය.		
ඝ)	9.9.3 නියෝගය	බලපත්‍රලාභී බැංකුවක් ගණුදෙනුකරුගේ දත්තවලට නිරාවරණය වන තොරතුරු පද්ධති සඳහා තෙවන පාර්ශවීය සේවා සපයන්නන් විසින් කළමනාකරණය කරන ලද හෝ හිමිකාරීත්වය දරන තොරතුරු පද්ධති යටිතල පහසුකම් භාවිතා කරන විට, නව හෝ දැනට සිටින ගනුදෙනුකරුවෙකු සමඟ නව ව්‍යාපාරික සම්බන්ධතාවයකට එළඹීමට පෙර, තෙවන පාර්ශවීය සේවා සපයන්නන්ට ගණුදෙනුකරුගේ දත්ත නිරාවරණය කිරීම සඳහා ගණුදෙනුකරුගේ නිශ්චිත කැමැත්ත ලබා ගත යුතුය. තවද, ගණුදෙනුකරුගේ දත්තවලට නිරාවරණය වන ඕනෑම තොරතුරු පද්ධතියක් දැනටමත් තෙවන පාර්ශවීය සේවා සපයන්නන් විසින් කළමනාකරණය කරන ලද හෝ හිමිකාරීත්වය දරන තොරතුරු පද්ධති යටිතල පහසුකම් භාවිතා කරන්නේ නම්, බලපත්‍රලාභී බැංකුවක් විසින් එවැනි තොරතුරු පද්ධතිවල ගබඩා කර ඇති හෝ සැකසූ දත්ත හිමි සියලුම ගනුදෙනුකරුවන්ට එවැනි විධිවිධානයක් පිළිබඳව දැනුම් දිය යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් බැංකුව හිමිකාරීත්වය දරන සහ කළමනාකරණය කරන ලද තොරතුරු පද්ධති යටිතල පහසුකම් භාවිතා කරන තොරතුරු පද්ධතියක්, තෙවන පාර්ශවීය සේවා සපයන්නන් විසින් කළමනාකරණය කරන හෝ හිමිකාරීත්වය දරන තොරතුරු පද්ධති යටිතල පහසුකම් වෙත සංක්‍රමණය කරන සෑම අවස්ථාවකම ගබඩා කර ඇති හෝ සැකසූ දත්ත හිමි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

		ගනුදෙනුකරුවන්ගේ නිශ්චිත කැමැත්ත ලබා ගත යුතුය. කෙසේ වෙතත්, බැංකුව ඒ අනුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.		
2.	2013 දෙසැම්බර් 02 දිනැති මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත නිකුත් කරන ලද නියෝග, තීරණ සහ චක්‍රලේඛ			
	අ) 3(1) (iii) වගන්තිය	අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 07 ට නොඅඩු සහ 13 ට නොවැඩි විය යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 6 දෙනෙකුගෙන් පමණක් සමන්විත විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
	ආ) 3(2) (iv) වගන්තිය	අධ්‍යක්ෂ මණ්ඩලයට අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් අතරින් වැඩි ප්‍රමාණය සිටිය යුතුය. කෙසේ වෙතත්, 2024 වර්ෂය සඳහා 2024 නොවැම්බර් 08 වන දින දක්වා මහ භාණ්ඩාගාරයෙන් ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු පත් කර නොතිබුණි. (පෙර මහ භාණ්ඩාගාරයේ සාමාජිකයා 2023 සැප්තැම්බර් 27 වන දින තේරී පත් විය). තවද, 2024 වර්ෂයේ 4 වන කාර්තුවේදී එක් එක් කොටස් හිමි බැංකුවලින් ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු පත් කර නොතිබුණි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

ඇ)	3(1) (iii) වගන්තිය	අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා රැස්විය යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ආසන්න වශයෙන් මාසික කාල පරතරයන්හිදී වර්ෂයකට අවම වශයෙන් දොළොස් වතාවක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, 2024 සැප්තැම්බර් 10 වන දින දක්වා රැස්වීම් 15 ක් පවත්වා තිබූ අතර ගණපූර්ණය නොමැතිකම හේතුවෙන් ඉන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. මෙය අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණයකින් තොරව සැලකිය යුතු පරතරයක් ඇති කළ අතර, ආසන්න වශයෙන් මාසික කාල පරතරයන්හිදී වර්ෂයකට අවම වශයෙන් 12 වතාවක් රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතාවය උල්ලංඝනය කර ඇත.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ඈ)	3 (6) (v) (ඉ) වගන්තිය	යාවත්කාලීන කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලු අංශ තක්සේරු කිරීම සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුමය වශයෙන් රැස්විය යුතුය. කෙසේ වෙතත්, කමිටුව 2024 වර්ෂය තුළදී තුන් වතාවක් පමණක් රැස් වූ අතර, වර්ෂයේ සිව්වන කාර්තුවේදී කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ඉ)	3 (6) (v) (ඊ) වගන්තිය	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සෑම රැස්වීමකින්ම සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය සහ/හෝ නිශ්චිත නියෝග ලබා ගත යුතුය. කෙසේ වෙතත්, බැංකුවේ ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳ වාර්තාව මාසිකව සකස් කර ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කරනු ලබයි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	මෙම රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම.

	ඊ)	3 (1) (i) (ජේ) වගන්තිය	අධ්‍යක්ෂ මණ්ඩලයේ සිය පාලන පරිචයන්හි ඵලදායීතාවය වරින් වර තක්සේරු කළ යුතුය, පහත සඳහන් දෑ ඇතුළත් වේ. • අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් තෝරා ගැනීම, නාමයෝජනා කිරීම සහ තෝරා පත් කර ගැනීම; • අභිලාශ අතර ගැටුම් කළමනාකරණය කිරීම; සහ • දුර්වලතා තීරණය කිරීම සහ අවශ්‍ය විට වෙනස්කම් ක්‍රියාත්මක කිරීම; කෙසේ වෙතත්, 2024 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් නව දෙනෙකුගෙන් පස් දෙනෙකු පමණක් ඔවුන්ගේ ස්වයං තක්සේරු ආකෘති පත්‍ර ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය විය. අසම්පූර්ණ ඉදිරිපත් කිරීම් දුර්වල විස්තීර්ණ ස්වයං-ඇගයීමට සහ පාලන පරිචයන්හි නොවිසඳු දුර්වලතා සඳහා බලපෑ හැකි අතර, එය තීරණ ගැනීම සහ වගවීම කෙරෙහි බලපායි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	මෙම රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම.
3.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය - II වෙළුම				
	අ)	10:1 සහ 10:2 වගන්ති	කිසියම් තනතුරක් සඳහා තෝරාගත් අපේක්ෂකයෙකු රජයේ වෛද්‍ය නිලධාරියෙකු යටතේ වෛද්‍ය පරීක්ෂණයකට යොමු කළ යුතු අතර, පොදු 169 ආකෘති පත්‍රය ආයතන ප්‍රධානියා වෙත යැවීමට කටයුතු කළ යුතුය. කෙසේ වෙතත්, විගණන සත්‍යාපනය සඳහා තෝරාගත් විධායක නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනු 5 අතරින් 3 ක (ගොනු අංක 0557, 2890 සහ 3272) 169 වෛද්‍ය ආකෘති පත්‍රය නොමැති බව නිරීක්ෂණය විය.	නිලධාරීන් දෙදෙනෙකුට අදාළ වෛද්‍ය ආකෘති පත්‍ර (පෞද්ගලික ලිපිගොනු අංක 557 සහ 3272) ඔවුන්ගේ අදාළ පුද්ගලික ලිපිගොනුවල ඇත. පුද්ගලික ලිපිගොනු අංක 2890 ට අයත් නිලධාරියා දැනටමත් විශ්‍රාම ගොස් ඇත. තවද, සඳහන් කරන ලද පොදු 169 වෛද්‍ය ආකෘති පත්‍රය දැනට බැංකුවේ වෛද්‍ය පරීක්ෂණ සඳහා භාවිතා කරනු ලබයි.	මෙම රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම.

ආ)	XLVIII පරිච්ඡේදයේ 22:1:1 උප වගන්තිය සංශෝධනය කිරීම.	නිලධාරියෙකුගේ විෂමාචාරයට එරෙහිව නිකුත් කරන ලද චෝදනා පත්‍රයක් මත පවත්වනු ලබන විනය පරීක්ෂණයක්, එවැනි විනය පරීක්ෂණයක් ආරම්භ කර මාස හයක කාලයක් ඇතුළත අවසන් කළ යුතුය. බැංකුවේ විනය නීති සංග්‍රහයේ 25.8 වගන්තියේ මෙම අවශ්‍යතාවයම නැවත අවධාරණය කර ඇති අතර, දින 180 ක කාල සීමාවක් නියම කරයි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට මුළු විනය පරීක්ෂණ 82 ක් අතරින් 38 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් තිස්සේ නොවිසඳී ඇති බව නිරීක්ෂණය විය. සහකාර සාමාන්‍යාධිකාරීගේ (විමර්ශන) 2025 මැයි 15 දිනැති ලිපියට අනුව, රු. 67,617,084 ක මුළු මූල්‍ය අලාභයක් සහිත නොවිසඳුණු විනය ගැටළු 15 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් තිස්යේ පැවති අතර ගැටළු 07 ක් වර්ෂ පහකට වැඩි කාලයක් තිස්සේ පවතී.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	මෙම රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම.
4.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය			
	2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 (ආයතන සංග්‍රහයේ II වෙළුමේ XLVIII පරිච්ඡේදයේ 13:2 උප වගන්තිය සංශෝධනය කිරීම)	විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් නියෝග කරන අධිකාරියක්, එවැනි නියෝගයක් නිකුත් කරන අවස්ථාවේදී, මූලික විමර්ශනයේ නිලධාරියාට හෝ නිලධාරීන්ගේ කමිටුවට මාස දෙකක කාලයක් තුළ එවැනි මූලික පරීක්ෂණයක් අවසන් කරන ලෙස දැඩි ලෙස නියෝග කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුවේ විනය නීති සංග්‍රහයට අනුව මූලික විමර්ශනය අවසන් කිරීම සඳහා නිශ්චිත කාල සීමාවක් සඳහන් කර නොතිබූ අතර 14.5 වගන්තියේ මූලික විමර්ශන කාලය "සාධාරණ කාල සීමාවක් තුළ" ලෙස බැංකුව අර්ථ දක්වා තිබුණි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	මූලික විමර්ශන සම්පූර්ණ කිරීම සඳහා පැහැදිලි කාල රාමුවක් නිශ්චිතව සඳහන් කර, නියමිත කාල සීමාව තුළ සියලුම විමර්ශන පවත්වන බවට සහතික වීම.

		2025 මැයි 15 වන දින බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී (විමර්ශන) විසින් විගණනයට ලබා දුන් තොරතුරු මත පදනම්ව, 2024 දෙසැම්බර් 31 වන දිනට විනය නීති උල්ලංඝනය කිරීමේ අවස්ථා 82 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ අදාළ රෙගුලාසිවලට අනුකූලව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.		
5.	බැංකුවේ මෙහෙයුම් අත්පොත			
i.	2024 වර්ෂය සඳහා බැංකුවේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා 40 ක් සමාලෝචනය කිරීමෙන් පසුව පහත නිරීක්ෂණ සිදු කර ඇත.			
අ)	2.2.8 වගන්තිය	එකම ඉතුරුම් ගිණුම් කේතය යටතේ ඉතිරිකිරීමේ ගිණුම් එකකට වඩා පවත්වාගෙන යාම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට තහනම් කර ඇත. ඇතැම් ශාඛා මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොමැති බව නිරීක්ෂණය විය. උදා: කොළොන්න, වවුනියා, කහවත්ත, කලවාන, කුරුණෑගල සහ මාවනැල්ල ශාඛා	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ආ)	2.3.1 වගන්තිය	ඉතුරුම් ගිණුම් විවෘත කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි, එනම් මැන්ඩේට්ස්, KYC ආකෘති පත්‍ර හෝ අනන්‍යතාව තහවුරු කිරීමේ ලේඛන, ශාඛා 18 ක නොතිබූ බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ඇ)	6.3.3 වගන්තිය	සුරක්ෂිතාගාර යතුරු ද්විත්ව පාලනයක් යටතේ පවත්වාගෙන යා යුතු අතර තනි නිලධාරියෙකුගේ භාරයේ තබා නොගත යුතුය. කෙසේ වෙතත්, ශාඛා 11 ක, සුරක්ෂිතාගාර යතුරු නොසැලකිලිමත් ලෙස හසුරුවා ඇති බවත්, නිසි වාර්තා පවත්වා නොමැති බවත් නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ඈ)	6.8 වගන්තිය	ශාඛා කළමනාකරු හෝ වෙනත් නිලධාරි ශ්‍රේණියේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් දිනපතා ස්වයං විගණනයක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්,	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට

		ශාඛා 13 ක් අවශ්‍ය පරිදි දිනපතා ස්වයං විගණන පවත්වා නොමැති බව නිරීක්ෂණය විය.		කටයුතු කළ යුතුය.
ii.	2.2.10 වගන්තිය	ගිණුම් හිමියෙකුගේ මරණය තහවුරු වූ පසු, අනවසර ගනුදෙනු වැළැක්වීම සඳහා ඔහුගේ/ඇයගේ නම යටතේ ඇති සියලුම ගිණුම් සීමා කළ යුතුය. කෙසේ වෙතත්, ඇතැම් ශාඛා මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොමැති බව නිරීක්ෂණය විය. උදා: මියගිය ගනුදෙනුකරුවන්ට අයත් පිළියන්දල ශාඛාවේ ගිණුම් 5 ක් සහ වරකාගොඩ ශාඛාවේ ගිණුම් 12 ක් විගණිත දිනය වන විට සක්‍රීය තත්ත්වයේ පැවතුනි.	දැන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
iii.	2.6.7 වගන්තිය	නියමිත ක්‍රියාපටිපාටියට අනුව, අක්‍රිය ගිණුම් සක්‍රිය කිරීමේ ලේඛනය නිශ්චිත ආකෘතියෙන් පවත්වා ගත යුතු අතර, ඕනෑම අක්‍රිය ගිණුමක් සක්‍රිය කිරීමට පෙර, ඒ ශ්‍රේණියේ සහ බී ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනාම අවසරය ලබා දෙමින් ලේඛනයට අත්සන් කළ යුතුය. කෙසේ වෙතත්, නියැදි විගණනයේදී, අවශ්‍ය වන ඒ ශ්‍රේණියේ සහ බී ශ්‍රේණියේ නිලධාරීන්ගේ අත්සන් අක්‍රිය ගිණුම් සක්‍රිය කිරීමේ ලේඛනයේ නොතිබූ බව නිරීක්ෂණය විය. උදා: පිළියන්දල සහ මාවරමණ්ඩි ශාඛා.	දැන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
iv.	2.6.8 වගන්තිය	ගනුදෙනුකරුගේ සෘජු ඉල්ලීමකින් තොරව ණය වාරික අයකර ගැනීම, මුදල් අය කිරීම හෝ වැරදි සටහන් නිවැරදි කිරීම වැනි අරමුණු සඳහා ශාඛාවක් අක්‍රිය ගිණුමක් සක්‍රිය කිරීමට අදහස් කරන්නේ නම්, 2094 ආකෘතිය නිසි ලෙස සම්පූර්ණ කර තාවකාලික සක්‍රිය කිරීම සඳහා ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීගේ නිර්දේශය සමඟ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ඇතැම් ශාඛා මෙම අවශ්‍යතාවයට අනුකූල නොවූ බව	දැන් එය නිවැරදි කර ඇත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

		නිරීක්ෂණය විය. මෙය නියමිත ක්‍රියා පටිපාටිවලට අනුකූල නොවීම පිළිබිඹු කරන අතර අනවසර හෝ අක්‍රමවත් ගිණුම් සක්‍රිය කිරීමේ අවදානම වැඩි කරයි. උදා: පිළියන්දල ශාඛාවේ අක්‍රිය ගිණුම් 2 ක් සහ මාවරමණ්ඩිය ශාඛාවේ අක්‍රිය ගිණුම් 4 ක් නිරීක්ෂණය විය.		
v.	3.6 වගන්තිය	මෙහෙයුම් ක්‍රියා පටිපාටිවලට අනුව, මුදල් අයකැමියන් විසින් සංචිත මුදල් සුරක්ෂිතාගාර ලේඛනයේ ගනුදෙනු සටහන් කිරීමෙන් තොරව සංචිත සුරක්ෂිතාගාරට මුදල් මාරු කළ බව නිරීක්ෂණය විය. උදා: පානදුර ශාඛාව	මෙහෙයුම් අත්පොත අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
vi.	3.8 වගන්තිය	පද්ධතියට ඇතුළත් කිරීමෙන් තොරව මුදල් අයකැමිවරුන් අතර මුදල් හුවමාරු කර ගෙන තිබුණි. ජංගම මුදල් එකතු කරන්නා විසින් ලබා දුන් මුදල්, අයකැමියාගේ මුදල් වෙත මාරු කිරීමෙන් තොරව මුදල් අයකැමියා සතුව පැවතුනි. උදා: පානදුර, අවිස්සාවේල්ල ශාඛා	ලබා දී ඇති උපදෙස් සහ නිසි ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
vii.	3.11.4 වගන්තිය	ක්‍රියාපටිපාටියට අනුව, දවස අවසානයේ මුදල් තුලනය කිරීමෙන් පසු, නිසි සත්‍යාපනය සහ වගවීම සහතික කිරීම සඳහා අදාළ වාර්තා ශාඛා කළමනාකරු සහ ඉතිරිකිරීමේ නිලධාරියා විසින් අත්සන් කළ යුතුය. කෙසේ වෙතත්, මෙම අවශ්‍යතාවය ශාඛා කිහිපයකම අනුගමනය කර නොතිබුණි.	මෙහෙයුම් අත්පොත අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත.	මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

		උදා: පානදුර, අවිස්සාවේල්ල සහ මාවරමණ්ඩිය ශාඛා		
6.	බැංකුවේ අභ්‍යන්තර චක්‍රලේඛ			
i.	කාර්යාල උපදෙස් චක්‍රලේඛ			
අ)	2010/10 හි 17 වගන්තිය - (සංවර්ධන ණය)	කාර්ය මණ්ඩල උකස් සීමාවන් සඳහා ශාඛාව විසින් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී වෙතින් ආවරණ අනුමැතිය ඉල්ලා සිටිය යුතුය. කෙසේ වෙතත්, මෙම නියෝගයට පටහැනි සමහර අවස්ථා නිරීක්ෂණය විය. උදා: පානදුර ශාඛාව	බැංකුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත.	චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ආ)	2010/10 හි 5.3 වගන්තිය - (සංවර්ධන සංශෝධිත)	චක්‍රලේඛයට අනුව, භෞතික රන් කැරට් අගය 18 ට අඩු උකස් භාණ්ඩ ඇපයක් ලෙස පිළි නොගත යුතුය. කෙසේ වෙතත්, විගණනයේදී, අවශ්‍ය ප්‍රමිතියට වඩා අඩු කැරට් අගයන් සහිත උකස් භාණ්ඩ පහක් පිළියන්දල ශාඛාව විසින් පිළිගෙන තිබූ බව නිරීක්ෂණය විය.	අදාළ නිලධාරීන් දැන් උකස් කුවිතාන්සියට අත්සන් කර කැරට් වටිනාකම සත්‍යාපනය කර ඇති බව තහවුරු කර ඇත.	චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
ඇ)	2020-209, 2021-226 සහ 2024-249 හි 4(vi) වගන්තිය	නියම කරන ලද කොන්දේසිවලට අනුව, ණය පැහැර හැරීමේ තත්ත්වයක සිටින ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් ලබා නොදිය යුතුය. කෙසේ වෙතත්, CRIB වාර්තාවලින් පැහැදිලි වන පරිදි, ණය ගැණුම්කරුවන්ගේ අහිතකර ණය වාර්තා තිබියදීත් ණය ලබා දී ඇති අවස්ථා නිරීක්ෂණය විය. • රු. මිලියන 30 ක් වූ ණය අංක 501088900010 සඳහා, ප්‍රාථමික ණය ගැණුම්කරුට දින 90 කට වඩා කල් ඉකුත් වූ පහසුකම් 02 ක් ඇතුළුව හිඟ ණය පහසුකම් 07 ක් තිබූ අතර, ඒකාබද්ධ ණය ගැණුම්කරුට දින 90 කට වඩා කල් ඉකුත් වූ පහසුකම් 01 ක් ඇතුළුව හිඟ ණය පහසුකම් 04 ක් තිබුණි. • රු. මිලියන 2.4 ක් වූ ණය අංක 722088500027 සඳහා, ණය	එකඟ වේ. 2025 සැප්තැම්බර් 30 වන දින වන විට ශාඛාව සමඟ සම්බන්ධීකරණයෙන් නිසි සැලැස්මක් සහිතව මෙම ගැටළුව විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.	චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

	ගැණුම්කරුට එකතුව රු. 785,410 ක් වූ හිඟ ණය පහසුකම් තිබුණි. • රු. මිලියන 5 ක් වූ ණය අංක 809089000003 සඳහා, දෙවන ණය ගැණුම්කරුට රු. 314,716 ක් වූ හිඟ ණය පහසුකමක් තිබුණි.		
ii. කාර්යාල මෙහෙයුම් චක්‍රලේඛ 2010/05	අවශ්‍යතාවයන්ට අනුව, ණය අයදුම්කරුවන්ගේ ස්ථිර ලිපිනය සත්‍යාපන ලේඛනය (ආකෘති අංක 702- සී(i)) ණය ලිපිගොනුවල පවත්වා ගත යුතුය. කෙසේ වෙතත්, මුළු ණය වටිනාකම රු. මිලියන 178 ක් වූ ණය ලිපිගොනු 15 ක මෙම ලේඛනය නොමැති බව නිරීක්ෂණය විය. තවද, රු. මිලියන 20 ක් වූ ණය අංක 243083700001 සම්බන්ධයෙන්, ආකෘති අංක 83, ආකෘති අංක 84, සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නිකුත් කරන ලද ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අලුත් කරන ලද අනුකූලතා වාර්තාව ද ණය ලිපිගොනුවේ නොතිබුණි.	එකඟ වේ. 2025 ජූලි 31 වන විට මෙම ගැටළුව නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.	චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
iii. මානව සම්පත් චක්‍රලේඛය			
2023/02 හි 3.4.5 වගන්තිය - බැංකු සහතික කිරීම	අදාළ චක්‍රලේඛයට අනුව, ආරක්ෂාව සහ මුදල් ප්‍රවාහන මාර්ගෝපදේශවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ත්‍රිරෝද රථ හෝ යතුරුපැදි මගින් ප්‍රවාහනය කරන ජංගම මුදල් රු. 800,000 කට සීමා කර ඇත. කෙසේ වෙතත්, ඇතැම් ශාඛා විසින් එම සීමාව ඉක්මවා ඇති බව නිරීක්ෂණය විය. උදා: අවිස්සාවේල්ල සහ මාවරමණ්ඩිය ශාඛා	බැංකුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත.	අදාළ චක්‍රලේඛවලට අනුකූල වීම සහතික කිරීමට කටයුතු කළ යුතුය.

1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 අංක 04 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ 7 වන වගන්තියට අනුව, 84 ඒ වගන්තියේ විධිවිධාන යටතේ අත්තිකාරම් ආදායම් බදු අඩු කර ඇති සෑම රඳවා ගැනීමේ නියෝජිතයෙකුම, ජුනි තිස් වන දින, සැප්තැම්බර් තිස් වන දින සහ දෙසැම්බර් තිස් එක් වන දිනෙන් අවසන් වන සෑම කාර්තුවක්ම අවසන් වීමෙන් දින තිහක් ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි කාර්තුමය ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගොනු කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා රඳවා ගැනීමේ බදු වාර්තා ගොනු කිරීමට බැංකුව අපොහොසත් වී තිබුණි. 2024 වර්ෂය තුළදී බැංකුව විසින් රු. 1,038,933,915 ක රඳවා ගැනීමේ බදු මුදලක් ගෙවා ඇතත්, රඳවා ගැනීමේ බදු අඩු කර ඇති සහ නිදහස් කරන ලද පොලී ආදායම පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මූලික බැංකුකරණ පද්ධතිය මඟින් ජනනය කරන ලද තොරතුරු නොමැතිකම හේතුවෙන් බැංකුවට රඳවා ගැනීමේ බදු තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, මෙය දැනටමත් ප්‍රතිසාධනය කර ඇති අතර, දත්ත දැනට සැකසෙමින් පවතී. 2025 මාර්තු 31 දිනට පෙර අපට සියලුම ගොනු කළ යුතු බදු වාර්තා උඩුගත කිරීමට හැකි වනු ඇත. ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම නිසා මධ්‍යගත ක්‍රියාවලිය භාවිතා කිරීමෙන් තොරව නිදහස් පොලිය සත්‍යාපනය කළ නොහැක. කෙසේ වෙතත්, නිදහස් පොලිය ශාඛා මට්ටමින් වාර්තා කර ඇති අතර වාර්තා කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කළ පසු එය නිවැරදි කරනු ඇත.	කාර්තුමය රඳවා ගැනීමේ බදු වාර්තා නිවැරදිව සහ ව්‍යවස්ථාපිත කාලසීමාවන් තුළ ගොනු කිරීම සහතික කිරීම සඳහා මූලික බැංකුකරණ පද්ධතියේ ගැටළු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.9.1 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1. තෙවන පාර්ශවීය සැපයුම්කරුවකු විසින් සපයනු ලබන C-Panel මත පදනම් වූ විද්‍යුත් තැපැල් විසඳුමක් මත බැංකුව විශ්වාසය තබන බැවින්, එය බැංකුවේ ආරක්ෂාව, අනුකූලතාවය සහ මෙහෙයුම් පාලනයන් කෙරෙහි බලපෑ හැකි පහත සඳහන් අවදානම් සහ අකාර්යක්ෂමතා සමඟ සම්බන්ධ වේ.		
i. බැංකුවේ වත්මන් විද්‍යුත් තැපැල් විසඳුමේ, උසස් ස්පෑම් /ෆිෂිං පෙරහන, ඇමුණුම් සැන්ඩ්බොක්සිං, වසම් සත්‍යාපනය සහ සංවේදී සන්නිවේදනයන් සඳහා සංකේතනය වැනි කර්මාන්ත සම්මත ආරක්ෂක පාලනයන් නොමැත. ii. බැංකුව එහි විද්‍යුත් තැපැල් සන්නිවේදනය සඳහා කිසිදු උපස්ථ පද්ධතියක්	මෙය විසඳීම සඳහා බැංකුව දැනටමත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර කළමනාකරණ උපදෙස් සහ අයවැය ලබා ගැනීමේ හැකියාව අනුව, පවතින අවදානමට ලක්විය හැකි විද්‍යුත් තැපැල් සත්කාරක විසඳුම ප්‍රතිස්ථාපනය කිරීම	බැංකුවේ විද්‍යුත් තැපැල් ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කිරීම.

පවත්වාගෙන නොයන අතර එම නිසා අහම්බෙන් මකාදැමීම, පද්ධති අසමත්වීම, සයිබර් ප්‍රහාර, දත්ත දූෂණය ආදිය සිදුවුවහොත් තීරණාත්මක ව්‍යාපාරික ලිපි හුවමාරු සහ වාර්තා අවදානමට ලක් වේ.	සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අපි ආරම්භ කර ඇත.	
iii. විද්‍යුත් තැපැල් පද්ධතිය තෙවන පාර්ශවයක් විසින් කළමනාකරණය කරනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස වින්‍යාස කිරීම්, ආරක්ෂක ප්‍රතිපත්ති සහ දත්ත කළමනාකරණය වැනි සමහර ක්‍රියාකාරකම් කෙරෙහි බැංකුවට සීමිත පාලනයක් ඇත.	මේ අනුව, බැංකුව විසින් සවිස්තරාත්මක ලංසු ලේඛනයක් පිළියෙල කරන ලද අතර, එය පසුව ප්‍රසම්පාදන අංශයට ඉදිරිපත් කරන ලදි. කෙසේ වෙතත්, වරින් වර විවිධ හේතූන් මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද විය. බැංකුවේ අහිතකර මූල්‍ය තත්ත්වය හේතුවෙන් පළමු ප්‍රසම්පාදනය අවලංගු කරන ලදි.	
iv. විගණනයට ලැබී ඇති තොරතුරුවලට අනුව, විද්‍යුත් තැපැල් සේවාදායකය වසර ගණනාවකට පෙර කුලියට ගෙන ඇත. එය විද්‍යුත් තැපැල් බිඳවැටීම් හෝ දත්ත නැතිවීමේ අවදානම වැඩි කළ හැකිය.	අඩුම මිල විසඳුම විස්තීර්ණ විද්‍යුත් තැපැල් ආරක්ෂක විශේෂාංගය සපුරා නොමැති නිසා දෙවන ප්‍රසම්පාදනය අවලංගු කරන ලදි. මෙම සියලු සාධක සැලකිල්ලට ගනිමින්, තොරතුරු තාක්ෂණ අංශය විද්‍යුත් තැපැල් ආරක්ෂණ සහ විද්‍යුත් තැපැල් සත්කාරක විසඳුම් දෙකම තනි, ඒකාබද්ධ විසඳුමකට ඒකාබද්ධ කරන නව යෝජනාවක් නැවත ඉදිරිපත් කර ඇත.	
v. විගණනයට දැනට ලැබී ඇති තොරතුරුවලට අනුව, බැංකුවේ පවතින විද්‍යුත් තැපැල් විසඳුම කර්මාන්තයේ හොඳම පරිචයන් සමඟ නොගැලපෙන බව නිරීක්ෂණය වූ අතර, මෙම තත්ත්වය බැංකුවේ මෙහෙයුම්වලට, ගණුදෙනුකරුවන්ගේ විශ්වාසයට සහ සමස්ත ස්ථාවරත්වයට හානි කරමින් දැඩි ප්‍රතිවිපාකවලට තුඩු දිය හැකි බව නිරීක්ෂණය විය.		
2. දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී බැංකුව සිය මූලික බැංකුකරණ පද්ධතියට වෙනස්කම් 03 ක් ක්‍රියාත්මක කර ඇත.		
i. වෙනස්කම් සංවර්ධනය කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයින් ලේඛනගත කර නොමැති බව නිරීක්ෂණය විය. මෙම පැවරීම නොමැතිකම වගවීමේ ඌනතාවයට හේතු වේ. මෙම දෝශ නිරාකරණයේ ප්‍රතිඵලයක් ලෙස සහ ක්‍රියාත්මක කිරීමෙන් පසු සමාලෝචන අභියෝගාත්මක වේ.	වත්මන් වෙනස් කිරීමේ ඉල්ලීම් අකෘතියේ වෙනස ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු සංවර්ධකයාගේ නම ග්‍රහණය කර ගැනීමට ක්ෂේත්‍රයක් ඇතුළත් නොවේ. කෙසේ වෙතත්, මෙම තොරතුරු ඇතුළත් කිරීම සඳහා අපි පවතින අකෘතිය සංශෝධනය කරනු ඇත.	අවශ්‍ය ලියකියවිලි සමඟ විධිමත් වෙනස්කම් කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

ii.	අනන්‍ය යොමු අංක පැවරීමෙන් තොරව වෙනස්කම් දෙකක් ක්‍රියාත්මක කර තිබූ බව නිරීක්ෂණය විය. නිසි හඳුනාගැනීමක් නොමැතිකම එලදායී ලෙස නිරීක්ෂණය කිරීමට සහ වෙනස් කිරීම් සැසඳීමට බාධා කරන අතර එමඟින් අනවසර හෝ සොයාගත නොහැකි වෙනස්කම් ඇතිවීමේ අවදානම වැඩි කරයි.	ඉදිරියට කරනු ලබන සෑම වෙනසක් සඳහාම අනන්‍ය හඳුනාගැනීමේ අංකයක් පවරනු ලබන අතර, එය මධ්‍යගත පාලන ලක්ෂ්‍යයක් හරහා නිකුත් කර නිරීක්ෂණය කරනු ලැබේ.	අවශ්‍ය ලියකියවිලි සමඟ විධිමත් වෙනස්කම් කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.
3.	සේවකයින් සඳහා නිර්මාණය කරන ලද මූලික බැංකුකරණ පද්ධති පරිශීලක ප්‍රවේශය අවසන් කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.		
i.	සේවකයින්ගේ නිල විශ්‍රාම දිනයෙන් පසුව පරිශීලක ගිණුම් 4 කට ප්‍රවේශ වී ඇති බවත් ඒවා ක්‍රියාකාරීව පවතින බවත් නිරීක්ෂණය විය. අනවසර පුද්ගලයින් විසින් සංවේදී පද්ධති සහ දත්ත වෙත ප්‍රවේශ වීමට මෙය හේතු විය හැකි බැවින් මෙම තත්ත්වය සැලකිය යුතු ආරක්ෂක අවදානමක් ඇති කරයි. තවද, පද්ධතියට ප්‍රෙවිශ වී ඇත්තේ කවුරුන්ද යන්න විමර්ශනය කිරීම සුදුසු වේ.	ක්‍රියාවලිය කඩිනම් කර ඇත. ඉල්ලා අස්වන හෝ විශ්‍රාම යන දිනට පෙර මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් යවන අතර, ඉල්ලා අස්වූ හෝ විශ්‍රාම ගිය දිනට පසු ඊළඟ වැඩ කරන දිනයේදී අපි විසින් පරිශීලක ප්‍රවේශය අවසන් කරයි.	සියලුම විශ්‍රාමික පරිශීලක ගිණුම් නිසි ලෙස අක්‍රිය කර ඇති බව සහතික කිරීම සඳහා දැඩි පරිශීලක ප්‍රවේශ පාලනයන් ක්‍රියාත්මක කිරීම.
ii.	අවසන් කිරීම හෝ සමාලෝචනය වැනි කිසිදු පරිපාලන ක්‍රියාමාර්ගයකින් තොරව, මූලික බැංකුකරණ පද්ධතිය තුළ පරිශීලක ගිණුම් 784 ක් අත්හිටුවීමේ තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. මෙම ගිණුම් 2013 සිට දීර්ඝ කාලයක් තිස්සේ කිසිදු ක්‍රියාකාරකමක් නොමැතිව පද්ධතිය තුළ පවතී. එවැනි ගිණුම් නිසි ලෙස කළමනාකරණය නොකරන්නේ නම්, එය සංවේදී බැංකු පද්ධති සහ දත්ත වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම සහ අනිසි ලෙස භාවිතා කිරීමට හේතු විය හැකි බව නිරීක්ෂණය විය.	අත්හිටුවීමක් අවසන් කිරීම ලෙස වෙනස් කිරීමට අවශ්‍ය නම්, පරිශීලකයා පළමුව නැවත සක්‍රිය කර පසුව අවසන් කිරීමේ විකල්පය යටතේ නැවත අවහිර කළ යුතුය. පරිශීලක අවහිර කිරීම සහ අවහිර කිරීම ඉවත් කිරීම සිදු කළ හැක්කේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ බලයලත් පුද්ගලයින්ට පමණි.	අත්හිටුවීමේ ගිණුම් නිසි ලෙස කළමනාකරණය කිරීමට පියවර ගත යුතුය.

iii.	අභ්‍යාසලාභීන්ට ඔවුන්ගේ පුහුණුවේ අපේක්ෂිත කාලයට අනුරූප වන පූර්ව නිශ්චිත අවසන් දිනයක් මත පදනම්ව පද්ධති ප්‍රවේශය ලබා දෙනු ලැබේ. මෙම නියමිත අවසන් දිනයට ළඟා වූ පසු ප්‍රවේශය ස්වයංක්‍රීයව අවලංගු කළද, ඔවුන්ගේ පුහුණු කාලය අවසන් වීමට පෙර බැංකුවෙන් පිටව යන අභ්‍යාසලාභීන් සඳහා පද්ධති ප්‍රවේශය අවසන් කිරීමට දැනට ස්වයංක්‍රීය හෝ අතින් සිදු කරන ක්‍රියාවලියක් නොමැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අභ්‍යාසලාභීන් කලින් සේවයෙන් ඉවත් කළහොත්, ඉතිරි පුහුණු කාලය සඳහා පද්ධතියට ප්‍රවේශ වීමට පද්ධතිය පහසුකම් සපයයි. මෙය සංවේදී පද්ධති සහ දත්ත වෙත ප්‍රවේශය වැඩි කිරීමට හේතු විය හැකි අතර, අනවසර ප්‍රවේශය හෝ අනිසි භාවිතය පිළිබඳ බරපතල අවදානමක් ඇති කරයි.	මාස දෙකක් මූලික බැංකුකරණ පද්ධතිය වෙත ප්‍රවේශ වී නොමැති අභ්‍යාසලාභී පරිශීලකයින් අක්‍රිය කිරීම සඳහා අපි නව ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇත. මෙම ක්‍රියාවලිය මසකට වරක් සිදු කෙරේ.	බැංකුවෙන් ඉවත් වන අභ්‍යාසලාභීන් සඳහා පද්ධති ප්‍රවේශය වහාම අවලංගු කිරීමට පියවර ගත යුතුය.
iv.	විගණනයට ලබා දී ඇති තොරතුරුවලට අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී බැංකුව විසින් මූලික බැංකුකරණ පද්ධති පරිශීලක ගිණුම් 159 ක් අවසන් කර ඇත. ඉල්ලා අස්වූ හෝ විශ්‍රාම ගිය සේවකයින් 57 දෙනෙකු සඳහා බැංකුවේ මූලික බැංකුකරණ පද්ධතියට පරිශීලක ප්‍රවේශය අවසන් කිරීමේදී දින 5 සිට දින 203 දක්වා සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. මෙය සංවේදී පද්ධති සහ දත්ත වෙත අඛණ්ඩව ප්‍රවේශ වීමට හේතු විය හැකි අතර එමඟින් අනවසර ප්‍රවේශය හෝ විභව අනිසි භාවිතය පිළිබඳ බරපතල අවදානමක් ඇති කරයි.	පරිශීලක ප්‍රවේශය අවසන් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇත. මාස දෙකක් මූලික බැංකුකරණ පද්ධතිය වෙත ප්‍රවේශ වී නොමැති අභ්‍යාසලාභී පරිශීලකයින් අක්‍රිය කිරීම සඳහා නව ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇත. මෙම ක්‍රියාවලිය මසකට වරක් සිදු කෙරේ.	සේවකයෙකු ඉල්ලා අස්වීම හෝ විශ්‍රාම යාමෙන් පසු, මූලික බැංකු පද්ධතියේ පරිශීලක ගිණුම් වහාම අක්‍රිය කිරීම සහතික කිරීම සඳහා දැඩි ප්‍රවේශ අවසන් කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.
v.	විගණනයට ලබා දුන් තොරතුරුවලට අනුව, මූලික බැංකුකරණ පද්ධතියේ ක්‍රියාකාරී පරිශීලක ගිණුම් 20 ක් වසර 01 සිට 08 දක්වා භාවිතයට නොගෙන පවතින බව නිරීක්ෂණය විය. උදාහරණයක් ලෙස, අභ්‍යාසලාභියකු සඳහා නිර්මාණය කරන ලද පරිශීලක හැඳුනුම්පත අංක 012611, 2014 සිට භාවිතයට නොගෙන සක්‍රිය තත්ත්වයේ පවතී. මෙම අක්‍රිය ගිණුම් පිවිසුම් ක්‍රියාකාරකම් හෝ පද්ධති භාවිතය පිළිබඳ කිසිදු සාක්ෂියක් නොපෙන්වන අතර, එවැනි ගිණුමක් හඳුනා ගැනීම සඳහා වරින් වර සමාලෝචනය කිරීමට විධිමත් ක්‍රියාවලියක් නොමැත.	මූලික බැංකුකරණ පද්ධතියට අක්‍රිය පරිශීලකයින් හඳුනාගෙන සලකුණු කිරීමට පහසුකමක් නොමැත. දැනටමත් පරිශීලකයින් 6 දෙනෙකු අවසන් කර ඇත.	මූලික බැංකුකරණ පද්ධතියේ සියලුම පරිශීලක ගිණුම් නිතිපතා සමාලෝචනය කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් හඳුන්වා දීමට පියවර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,275,449,488 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 863,517,816 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 411,931,672 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අනෙකුත් මෙහෙයුම් ආදායම් වැඩිවීම, පොලී වියදම් අඩුවීම සහ හානිකරණ ආපසු හැරවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් සමඟ පහත දක්වේ.

විස්තරය	විචලනය වැඩිවීම/ (අඩුවීම) (රු. මිලියන)	විචලනය ප්‍රතිශතය	විචලනයට හේතුව
පොලී ආදායම	(8,310.7)	18%	පොලී අනුපාත අඩුවීම.
පොලී වියදම	(10,922.2)	37.3%	ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සඳහා පොලී අනුපාත අඩු කිරීම.

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා බැංකුවේ වැදගත් අනුපාතයන් කිහිපයක් අංශයේ අනුපාත සමඟ පහත දැක්වේ.

	අංශ අනුපාත (බලපත්‍රලාභී විශේෂිත බැංකු) ප්‍රතිශතය	2024 ප්‍රතිශතය	2023 ප්‍රතිශතය
<u>ලාභදායිතා අනුපාත</u>			
ශුද්ධ ලාභ අනුපාතය (බදු පසු ලාභය)	6.39	3.22	1.81
ශුද්ධ පොලී ආන්තිකය	4.64	6.27	5.79
පොලී ආදායම මත ශුද්ධ පොලී ආදායම	38.18	51.56	36.65
මුළු ආදායමට පොලී නොවන ආදායම	2.29	4.12	2.85
පොලී ආදායමට පොලී පිරිවැය	61.82	48.44	63.35
මෙහෙයුම් වියදම් තුළ කාර්ය මණ්ඩල පිරිවැය	70.35	75.46	75.64
සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය (ROA)	1.40	1.03	0.40
ස්කන්ධය මත ප්‍රතිලාභය (ROE)	12.40	5.83	5.07
කොටසකට ඉපැයීම		2.27	1.54
<u>වත්කම් ගුණාත්මකභාවයඩ</u>			
අක්‍රීය අත්තිකාරම් අනුපාතය			
- හානිකරණය වූ ණය (අදියර 3) අනුපාතය (%) (ශුද්ධ අදියර 3 හානිකරණය)	12.40	6.25	8.80
- 3 වන අදියරේ ණයවලට හානිකරණ අනුපාතය (අදියර 3) (%)	34.50	41.88	36.03

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත	අවම අවශ්‍යතාවය		
පොදු ස්කන්ධය ස්ථර I ප්‍රාග්ධන අනුපාතය	8.5	9.51	10.09
මුළු ස්ථර I ප්‍රාග්ධන අනුපාතය	8.5	9.51	10.09
මුළු ප්‍රාග්ධන අනුපාතය	12.5	15.52	17.28
ද්‍රවශීලතා අනුපාත			
ද්‍රවශීලතා ආවරණ අනුපාතය	342.40	402.00	976.00
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය	179.50	152.00	174.00

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ලාභ අනුපාතය (බදු පසු ලාභය) සියයට 1.81 සිට සියයට 3.22 දක්වා වර්ධනයක් පෙන්නුම් කළද, එය අංශයේ සාමාන්‍ය අනුපාතය වන සියයට 6.39 න් අඩක් පමණ වේ.

ii. ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE) සියයට 5.83 ක් වූ අතර එය අංශයේ සාමාන්‍ය අනුපාතය වන සියයට 12.40 න් අඩකටත් වඩා අඩුය, එය කොටස් හිමියන් සඳහා දුර්වල ප්‍රතිලාභ පෙන්නුම් කරයි.

iii. සමාලෝචිත වර්ෂයේදී වත්කම් මත ප්‍රතිලාභය (ROA) සියයට 0.40 සිට සියයට 1.03 දක්වා වැඩිදියුණු වුවද, එය අංශයේ ROA වන සියයට 1.40 ට වඩා අඩුවෙන් පවතින අතර, එය ලාභ ජනනය සඳහා වත්කම් අකාර්යක්ෂම ලෙස භාවිතා කිරීම පෙන්නුම් කරයි.

iv. සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩල පිරිවැය මෙහෙයුම් වියදමෙන් සියයට 75.5 ක් වූ අතර එය අංශයේ සාමාන්‍ය අනුපාතය වන සියයට 70.30 ට වඩා ඉහළ අගයක් ගනී.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1. තීරණාත්මක සයිබර් ආරක්ෂණ වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රමාණවත් අයවැය සැලසුම් කිරීම/වෙන් කිරීම සිදු කර නොමැති බව සහ විද්‍යුත් තැපැල් ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය ලබා දී නොමැති බව නිරීක්ෂණය විය. විභව අවදානම් අවම කිරීම සඳහා විද්‍යුත් තැපැල් ආරක්ෂක පියවරයන් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ඉහළ කළමනාකාරිත්වයේ ප්‍රමාණවත් අවධානයක් සහ කැපවීමක් නොමැති බව මෙයින් පෙන්නුම් කරයි.	නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ උපායමාර්ගික තීරණ ගෙන ඇත.	තීරණාත්මක සයිබර් ආරක්ෂණ වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන සලසා ඇති බවට සහතික වීම.
2. ලෝක බැංකු මූල්‍ය ආධාර ඇතිව මුදල් අමාත්‍යාංශය විසින් 2015 දී ආරම්භ කරන ලද ධාන්‍ය ගබඩා ව්‍යාපෘතිය, තම අස්වැන්න ගබඩා කිරීමට ප්‍රමාණවත් ඉඩක් නොමැති ගොවීන්ට ගබඩා පහසුකම් සැපයීම සහ ගබඩා කළ බෝග ඇපයට තබා මූල්‍ය ආධාර ලබා ගැනීමට ඔවුන්ට හැකියාව ලබා දීම අරමුණු කරයි. බැංකුව විසින් සපයනු ලබන කළමනාකරණ සේවාවන් සමඟ උඩුල්දෙණිය, මැදිරිගිරිය, බුත්තල, මුරුන්කන් සහ කිලිනොච්චි යන ප්‍රදේශවල ගබඩා පහක් ස්ථාපිත කර ඇත. උඩුල්දෙණිය සහ බුත්තල ගබඩා පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණ සිදු කරන ලදි.		

උපුල්දෙණිය ගබඩාව

i. බැංකුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද විස්තරවලට අනුව, ගබඩා ධාරිතාව මෙට්‍රික් ටොන් 5,000 ක් ලෙස දක්වා ඇති අතර, ගිවිසුම් වාර්තාවල ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 3,300 ක ධාරිතාවක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී භාවිතය, ධාරිතාවට වඩා සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවති අතර පසුගිය වසර 4 ක කාලයට අදාළ ධාරිතා උපයෝජන විස්තර පහත පරිදි වේ.

	2020	2021	2022	2023	2024
ධාරිතා උපයෝජනය (මෙට්‍රික් ටොන්)	598	984	1,651	1,148	719
මෙට්‍රික් ටොන් 5,000 ක් වූ ධාරිතාවය මත උපයෝජනයේ ප්‍රතිශතය (%)	11.96	19.68	33.02	22.96	14.38

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.

ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගබඩා භාවිතය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ ගබඩා ධාරිතාව නිවැරදිව වාර්තා කිරීම සහතික කිරීම.

ii. 2015 මාර්තු 12 වන දින අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් බැංකුව සමඟ ඇති කරගත් ගිවිසුමේ 6.17 වගන්තියට අනුව, ගබඩා ගොඩනැගිල්ල නිසි ලෙස නඩත්තු කිරීම සඳහා ගබඩා කළමනාකරු වගකිව යුතුය. කෙසේ වෙතත්, පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

අ) ගබඩාවේ සමහර කොටස්වලට හානි සිදුවී ඇති අතර, එමඟින් කුරුල්ලන්ට (පරෙවියන්) සහ අනෙකුත් සතුන්ට ඇතුළුවීමට ඉඩ සැලසී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ධාන්‍ය වර්ග විනාශ වී ඇති අතර, එමඟින් සෞඛ්‍යාරක්ෂිත ගැටළු සහ ආහාර අපවිත්‍රණය වීමේ විභවයක් ඇති වී තිබේ .

ආ) විගණනයට ලබා දී ඇති තොරතුරුවලට අනුව, ස්ථාපිත කළ දින සිට බලධාරීන් විසින් නිසි නඩත්තුවක් සිදු කර නොතිබුණි.

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.

ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගබඩා කළමනාකරු විසින් අඩුපාඩු නිවැරදි කිරීමට සහ ගබඩා ගොඩනැගිල්ල නිසි තත්ත්වයෙන් නඩත්තු කිරීමට කඩිනම් පියවර ගන්නා බවට සහතික වීම.

iii. ස්ථාපිත කරන ලද යන්ත්‍ර සම්බන්ධයෙන් ගබඩා කළමනාකරු විසින් කරන ලද පැහැදිලි කිරීම් අනුව, පහත සඳහන් නිරීක්ෂණ සිදු කරන ලදි.

අ)	ගබඩාවේ ප්‍රධාන යන්ත්‍ර, එනම් ටොන් 5 එළිවේටර් (වියළන යන්ත්‍රය), එළිවේටර් සහිත වියළන යන්ත්‍රය සහ ධාන්‍ය ශෝධකය, 2015 දී ස්ථාපනය කළ දින සිට අක්‍රියව පවතී. ඒ අනුව, මෙම යන්ත්‍ර වසර 10 ක් තිස්සේ ඒවායේ අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කර නොතිබුණි. තවද, විගණනයට ලබා දී ඇති තොරතුරුවලට අනුව, 2015 මාර්තු 12 දිනැති මූලික ගිවිසුමේ 6.14 වගන්තිය යටතේ අවශ්‍ය පරිදි මෙම තත්ත්වය වගකිවයුතු නිලධාරීන්ට නිසි ලෙස වාර්තා කර නොතිබුණි. ඉහත යන්ත්‍රවල නිසි ක්‍රියාකාරී තත්ත්වයන් ගබඩාවේ එදිනෙදා කටයුතුවලට ඍජුවම බලපාන බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	ප්‍රධාන ගබඩා යන්ත්‍ර ඵලදායී ලෙස භාවිතා කිරීමට ක්ෂණික පියවර ගැනීම සහ නිසි ගබඩා මෙහෙයුම් සඳහා සහාය වීම සඳහා වගකිවයුතු නිලධාරීන්ට ඒවායේ තත්ත්වය කාලීනව වාර්තා කිරීම සහතික කිරීම.
ආ)	එහි අපේක්ෂිත අරමුණ සඳහා සුදුසු අංගසම්පූර්ණ රසායනාගාරයක් තිබුණද, 2015 දී මිලදී ගෙන ස්ථාපනය කරන ලද ශීතකරණ, රසායනාගාර උඳුන්, බීජ දෘඪතා පරීකණ යන්ත්‍ර, තරාදි, වියළන උඳුන්, ධාන්‍ය ඔප දැමීමේ යන්ත්‍ර, පරීක්ෂණ ලෙලි යන්ත්‍ර, බීජ ශෝධක, පෙරහන් කට්ටල, අත් ඇඹරුම් යන්ත්‍ර, සාම්පල බෙදුම් යන්ත්‍ර සහ බෑග් වැසුම් ඇතුළු බොහෝ යන්ත්‍ර සහ උපකරණ ස්ථාපනය කළ දින සිට භාවිතයට නොගෙන පවතී.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	ව්‍යාපෘතියේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා රසායනාගාර උපකරණ ඵලදායී ලෙස භාවිතා කිරීමට පියවර ගැනීම.
ඇ)	ගබඩාවේ කළමනාකරු විසින් කරන ලද පැහැදිලි කිරීම්වලට අනුව, සූර්ය විදුලිබල පද්ධතිය බිඳ වැටී ඇති අතර තොරතුරු විගණනයට ලබා දී නොතිබුණි. කෙසේ වෙතත්, විදුලි බිල්පත සම්පූර්ණයෙන්ම ගෙවා තිබූ අතර, ඉහත සඳහන් පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය සහ අපේක්ෂිත ප්‍රතිලාභය ලබා ගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් නිසි අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	වත්මන් තත්ත්වය මඟහරවා ගැනීමට සහ පද්ධතිය එහි අපේක්ෂිත කාර්ය සාධනය සහ ප්‍රතිලාභ සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.
ඈ)	CCTV පද්ධතිය ක්‍රියාත්මක වී නොතිබූ අතර අලුත්වැඩියා කටයුතු සිදු කර නොතිබුණි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	ගිවිසුමට අනුව අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කළ

<table>
<tr><td></td><td></td><td></td><td>යුතුය.</td></tr>
<tr><td>iv.</td><td>ගිවිසුම්වල අවශ්‍යතාවලට පටහැනිව, නිසි නඩත්තු වාර්තා සහ ලේඛන පවත්වාගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය විය. විශේෂයෙන්, තොග නිකුත් කිරීමේ සහ ලැබීමේ ලේඛනය, අස්වැන්නට අදාළ ගාස්තු ලේඛනය සහ සුළු මුදල් ලේඛනය වැනි අත්‍යවශ්‍ය ලේඛන නියමිත පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි.</td><td>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.</td><td>ගිවිසුම්වල නිශ්චිතව දක්වා ඇති පරිදි අවශ්‍ය සියලුම වාර්තා සහ ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.</td></tr>
<tr><td></td><td><u>බුත්තල ගබඩාව</u></td><td></td><td></td></tr>
<tr><td>v.</td><td>බැංකුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද විස්තරවලට අනුව, ගබඩාවේ ධාරිතාව මෙට්‍රික් ටොන් 5,000 ක් ලෙස සඳහන් කර ඇති අතර, ගිවිසුමේ ගබඩාවේ ධාරිතාව ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 3,300 ක් ලෙස සටහන් වී ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී භාවිතය, ධාරිතාවට වඩා සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවති අතර පසුගිය වසර 4 ක කාලයට අදාළ ධාරිතා උපයෝජන විස්තර පහත පරිදි වේ.
<table>
<tr><th></th><th>2020</th><th>2021</th><th>2022</th><th>2023</th><th>2024</th></tr>
<tr><td>ධාරිතා උපයෝජනය (මෙට්‍රික් ටොන්)</td><td>441</td><td>652</td><td>521</td><td>891</td><td>1158</td></tr>
<tr><td>මෙට්‍රික් ටොන් 5,000 ක් වූ ධාරිතාවය මත උපයෝජනයේ ප්‍රතිශතය (%)</td><td>8.82</td><td>13.04</td><td>10.42</td><td>17.82</td><td>23.16</td></tr>
</table></td><td>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.</td><td>ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගබඩා භාවිතය වැඩිදියුණු කිරීමට සහ නිවැරදි ගබඩා ධාරිතාව සහතික කිරීමට අවශ්‍ය පියවර ගැනීම.</td></tr>
<tr><td>vi.</td><td>විගණිත දිනය වූ 2025 ජූලි 17 වන දිනට, ප්‍රධාන අයිතම කිහිපයක් අක්‍රියව පැවතුනි. ගබඩාවේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා වඩාත් අත්‍යවශ්‍ය යන්ත්‍ර වන බීජ වියළනය සහ බීජ සෝධකය 2017 ජනවාරි 25 සිට ක්‍රියාත්මක වී නොතිබුණි. තවද, ෆෝක්ලිෆ්ට් යන්ත්‍රය 2025 මැයි සිට අක්‍රියව පැවතුනි.</td><td>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.</td><td>ව්‍යාපෘති අරමුණු අවසන් වශයෙන් සාක්ෂාත් කර ගැනීම සඳහා ගබඩා මෙහෙයුම් සුමටව සිදු කිරීම සහතික කිරීමට උපකරණ නිසි කාලයට අළුත්වැඩියා කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සංවිධානය කිරීම.</td></tr>
</table>

vii.	බැංකුව විසින් විගණනයට ලබා දුන් තොරතුරු මත පදනම්ව, කලින් පරීක්ෂා කරන ලද ගබඩාවලට අමතරව, මැදිරිගිරිය, මුරුන්කන් සහ කිලිනොච්චිය යන ගබඩා ද ඒවායේ අපේක්ෂිත අරමුණු සඳහා නිසි ලෙස ප්‍රයෝජනයට ගෙන නොමැති බව නිරීක්ෂණය විය. 2020-2024 කාලය තුළදී මෙම ගබඩාවල ධාරිතාවයේ සමස්ත උපයෝජනය ඉතා අඩු වූ අතර එය සියයට 1.75 සිට සියයට 31.67 දක්වා පරාසයක පැවතුන අතර, එමඟින් පවතින ධාරිතාවයේ සැලකිය යුතු ඌන උපයෝජනයක් පෙන්නුම් කරයි. විස්තර පහත පරිදි වේ.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	ගබඩා ඒවායේ අපේක්ෂිත අරමුණ සඳහා නිසි ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

ගබඩාව	මුළු ධාරිතාවයෙන් උපයෝජනය ප්‍රතිශතයක් ලෙස (%)				
	2020	2021	2022	2023	2024
මැදිරිගිරිය	2.96	4.84	2.95	1.75	4.83
මුරුන්කන්	2.04	8.16	10.48	11.84	16.26
කිලිනොච්චිය	25.27	31.67	25.87	26.72	30.17

3.	වෙළඳපොලේ ඩොලර් අනුපාත උච්චාවචනයන් අනුව, රු. 507,613,938.33 ක විනිමය අලාභයක් සහ රු. 99,416,882.43 ක විනිමය ලාභයක් හඳුනා ගන්නා ලදි. 2024 අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ බලපෑම රු. 408,197,056 ක විනිමය අලාභයක් විය.	බැංකුවේ එ.ජ.ඩො වත්කම් සහ වගකීම් නිරාවරණය 2024 වර්ෂයේදී දළ වශයෙන් එ.ජ.ඩො මිලියන 13 ක ශුද්ධ විවෘත තත්වයක් පෙන්නුම් කරයි. 2024 දී ඇමරිකානු ඩොලර්වලට සාපේක්ෂව රුපියලේ අගය තවදුරටත් ඉහළ යාම හේතුවෙන් බැංකුවට විනිමය අලාභයක් සිදුවිය. විනිමය අනුපාත උච්චාවචනයන් හේතුවෙන් අනාගතයේදී සිදුවන ඕනෑම අලාභයක් අවම කිරීම සඳහා බැංකුවේ ALCO විසින් 2024 ඔක්තෝබර් 10 වන දින NOP විකිණීමට තීරණය කළ අතර මීට පෙර එය බැංකුවට පාඩුවක් ඇති කර තිබුණි. ඒ අනුව, 2024 නොවැම්බර් 20 වන දින එ.ජ.ඩො මිලියන 13.2 ක් විකිණීමට බැංකුව විසින් තීරණය කරන ලදි. එබැවින්, අනාගතයේදී අමතර විනිමය අලාභ අවම කරනු ලැබේ.	විදේශ මුදල් අවදානම් කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1.	සමාලෝචිත වර්ෂයේදී ශාඛා පහක (පානදුර, පිළියන්දල, අවිස්සාවේල්ල, මාවරමණ්ඩිය සහ වරකාගොඩ) සිදු කරන ලද විගණනයේදී, ශාඛා වාර්තා පවත්වා ගැනීමේ සහ මෙහෙයුම් පාලනයන්හි පහත සඳහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය විය. i. අදාළ නිලධාරියා සහ දෙවන නිලධාරියා විසින් වවුචර් නිසි ලෙස අත්සන් කර නොතිබුණු අතර, කළමනාකරු විසින් නිසි ලෙස අවසර දී නොතිබුණි. ii. වවුචර් බණ්ඩල් කිරීමේ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. iii. වවුචර් මිටි නිසි පරිදි මුද්‍රා තබා නොතිබුණි. iv. ATM කාඩ්පත් තොග පොත නොමැති හෝ නිසි ලෙස නඩත්තු කර නොතිබුණි. v. ATM කාඩ්පත් නිකුත් කිරීමේ ලේඛනයේ ඒ ශ්‍රේණියේ නිලධාරීන්ගේ අත්සන් නොමැති වීම. vi. තැගි භාණ්ඩ තොග පොත නිසි ලෙස සමතුලිත වී නොමැති අතර ඒ සහ බී ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනාගේම අත්සන් නොතිබුණි. vii. උකස් තොග පොත යාවත්කාලීන කර නොතිබුණි. viii මියගිය ගිණුම් ලේඛනය යාවත්කාලීන නොවූ අතර ඒ සහ බී ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනාගේම අත්සන් නොතිබුණි. ix. මුදල් ප්‍රවාහන ලේඛනයේ බලයලත් නිලධාරීන්ගේ අත්සන් නොමැති වීම.	දැන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.	අදාළ සියලුම ලේඛන සහ තොග පොත් යාවත්කාලීනව, නිවැරදිව නඩත්තු කර ඇති බවත්, වගකිවයුතු නිලධාරීන් විසින් නිසි ලෙස අවසර දී ඇති බවත් ශාඛා සහතික කළ යුතුය.
2.	ණය ලිපිගොනු ප්‍රමිතිගත අන්තර්ගතය/පටුන සඳහා පිටුවක් සහ නිසි ගොනු යොමු අංකනයක් සහිතව නඩත්තු කර නොමැති බව නිරීක්ෂණය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, තීරණාත්මක ණය ලේඛන ක්‍රමානුකූලව සොයා ගැනීම සහ සත්‍යාපනය කිරීම දුෂ්කර වී ඇත.	සටහන් කර ගෙන ඇත.	ණය ලිපිගොනු නිසි ලෙස පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
3.	ඇතැම් ණය සඳහා ඇපකර ලේඛන ආරක්ෂිත භාරයේ තබා ගැනීම වෙනුවට ණය ලිපිගොනුවල ගොනු කර තිබූ බව නිරීක්ෂණය විය. එවැනි ණය සඳහා උදාහරණ ලෙස ණය අංක 811089200001, 722088500027, 809089000003 සහ 305089200001 ඇතුළත් වේ.	සටහන් කර ගෙන ඇත.	ලේඛනවල ආරක්ෂාව සහතික කිරීමට කටයුතු කළ යුතුය.
4.	ඇතැම් ශාඛාවල හදිසි පිටවීම් දොරටු නොමැති බව නිරීක්ෂණය විය. උදා: දෙවිනුවර සහ කැකණදුර ශාඛා.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	ශාඛාවල ආරක්ෂණ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 සැප්තැම්බර් 13 වන දින සහ 2023 සැප්තැම්බර් 27 වන දින බෝට්ටු නිෂ්පාදකයෙකු/ගැනුම්කරුවෙකු සඳහා පිළිවෙලින් ණය අංක 254083500028 සහ 254083500030 යටතේ එකතුව රු. 15,000,000 ක ණය දෙකක් බැංකුව විසින් ලබා දී තිබුණි. අදාළ ණය පහසුකම් ඇගයීමේ අකෘතියේ කොන්දේසියක් ඇතුළත් කර තිබූ අතර, එම මුදල බෝට්ටුවේ නිෂ්පාදකයාට චෙක්පතක් මගින් ඍජුවම ගෙවිය යුතු බව හෝ අදාළ බිල්පත් සහ ලේඛන සත්‍යාපනය කිරීමෙන් පසු ගණුදෙනුකරු විසින් දැනටමත් ගෙවා ඇති මුදල පියවිය යුතු බව නියම කර තිබුණි. ණය අංක 254083500030 යටතේ ණය ගැණුම්කරු විසින් බෝට්ටු නිෂ්පාදකයාට කරන ලද අත්තිකාරම් ගෙවීමක් සනාථ කිරීම සඳහා 2022 මාර්තු 08 දිනැති අංක බී 2446 දරන රු. 4,000,000 ක මුදල් පත්‍රිකාවක් ඉදිරිපත්කර තිබුණි. පසුව, ණය අංක 254083500030 යටතේ රු. 4,000,000 ක් සඳහා වන CEFT උපදේශය සඳහා ආධාරක ලේඛනයක් ලෙස එකම මුදල සහිත සහ එකම තොරතුරු සහිත 2023 ඔක්තෝබර් 02 දිනැති වෙනස් දිනයක් සහිත බී 2446 අංකය දරන එකම මුදල් පත්‍රිකාවක්, 2023 ඔක්තෝබර් 02 දින ණය ගැණුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණි. එබැවින්, මෙම ලේඛනය ව්‍යාජද යන්න පිළිබඳව විගණනයට සාධාරණ සැකයක් ඇත. එම ලේඛනයේ වලංගුභාවය සහ නිරවද්‍යභාවය තහවුරු කිරීමෙන් තොරව බැංකුව විසින් ඉහත ගනුදෙනුව ක්‍රියාත්මක කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.	එකඟ වේ. ශාඛාවට පැහැදිලි කිරීමේ ඉල්ලීමක් කර ඇති අතර, එය ලද පසු, 2025 අගෝස්තු 31 වන දිනට පෙර සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත.	ඕනෑම ගෙවීමක් ආරම්භ කිරීමට පෙර ලේඛනවල වලංගුභාවය සහ නිරවද්‍යභාවය සත්‍යාපනය කිරීමට කටයුතු කළ යුතුය.

3.4 අරමුදල් ඌන උපයෝජනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 වන දිනට PEACE ව්‍යාපෘති අරමුදලේ පොදු ලෙජර් ශේෂය රු. මිලියන 44 ක් වූ අතර එය 2015 සිට භාවිතා නොකර නොවෙනස්ව පවතී. ගම්වැසියන්ගේ සහ ගොවි සංවිධානවල ආදායම් උත්පාදන කටයුතු සඳහා ආධාර සැපයීමේ අරමුණින් මෙම අරමුදල ජාත්‍යන්තර සංස්ථාව සඳහා වූ ජපන් බැංකුවෙන් (JBIC) ලැබී තිබුණි. PEACE ව්‍යාපෘතියේ පොලී වියදම සඳහා වන පොදු ලේජර අංක 505105150 යටතේ, අරමුදල එහි අපේක්ෂිත අරමුණ සඳහා යොදවා නොතිබුණද, වාර්ෂිකව සියයට 2 ක පොලී වියදමක් හඳුනාගෙන තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය පිළිබඳව වාර්තාවක් ඉල්ලා ඇත. ඒ අනුව, ප්‍රධාන කාර්යාලය අදාළ ප්‍රාදේශීය කාර්යාලය වෙතින් එය ඉල්ලා ඇත. අපි එය ඔවුන්ගෙන් එකතු කළ වහාම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. කෙසේ වෙතත්, ගිවිසුම තවමත් අත්සන් කර නොමැති අතර, කෙටුම්පත්	PEACE ව්‍යාපෘති අරමුදල එහි අපේක්ෂිත අරමුණ සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

	ලේඛනය පවා බැංකුව වෙත ලැබී නොමැත. 2025 සැප්තැම්බර් 30 දිනට පෙර ගිවිසුම අත්සන් කිරීමට අපේක්ෂා කෙරේ.	

3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණනයට ලැබී ඇති තොරතුරුවලට අනුව, ප්‍රධාන කාර්යාලයේ එකතුව රු. 116,583,697 ක වටිනාකමක් සහිත පරිගණක මෘදුකාංග 08 ක් වර්තමානයේදී බැංකුව විසින් භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය.	බැංකුවේ අපහරණය කිරීමේ ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් එම මෘදුකාංග අපහරණය කිරීමට කටයුතු යොදා ඇත.	සංවිධානයේ සම්පත් වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1. **ක්ලවුඩ් පාදක විද්‍යුත් තැපැල් ආරක්ෂණ ද්වාරය** ක්ලවුඩ් පාදක විද්‍යුත් තැපැල් ආරක්ෂණ ද්වාරයක් මිලදී ගැනීම සඳහා බැංකුව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර තිබූ අතර විසඳුම සැපයීම, බෙදා හැරීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා 2024 ජුනි 03 සහ 2024 ජුනි 25 යන දිනවල පුවත්පත් දැන්වීමක් ප්‍රකාශයට පත් කර තිබුණි. බැංකුව ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සිදු කර තිබූ අතර, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ 2024 සැප්තැම්බර් 24 වන දින සුළු කොන්ත්‍රාත් පිළිබඳ මධ්‍යම ප්‍රසම්පාදන කමිටුව (CPC) වෙත යොමු කර තිබුණි. කෙසේ වෙතත්, වැඩිදියුණු කළ විද්‍යුත් තැපැල් ආරක්ෂණ ආරක්ෂාකරණයන් නොමැතිව සහ පැවතිය හැකි පිරිවැය-ඵලදායී විකල්ප සෙවීමකින් තොරව, අයවැය සීමාවන් හේතුවෙන් සුළු කොන්ත්‍රාත් පිළිබඳ මධ්‍යම ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදනය අවලංගු කරන ලදි. එමඟින් තීරණය අවසන් මොහොතේ අවලංගු කිරීම හේතුවෙන් ටෙන්ඩර් කිරීම සහ ලංසු ඇගයීම සඳහා වැය කළ සම්පත් අනාර්ථික විය.	ඉහළ මිල ගණන් සලකා බලා ප්‍රසම්පාදනය අවලංගු කිරීමට සුළු කොන්ත්‍රාත් පිළිබඳ මධ්‍යම ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇති අතර නව ප්‍රසම්පාදනයක් කැඳවීමට තීරණය කර ඇත. ප්‍රසම්පාදනයේ මූලික පිරිවැයට වඩා මුදලට අගය සලකා බලා ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදනය අවලංගු කිරීමට තීරණය කරන ලදි.	බැංකුවේ විද්‍යුත් තැපැල් ආරක්ෂණ ආරක්ෂාකරණයන් වැඩි දියුණු කිරීම සඳහා හැකි විකල්ප සොයා ගැනීමට නිර්දේශ කෙරේ.
2. **<u>ප්‍රාදේශීය සංවර්ධන බැංකු සන්නාමය සහිත 3 ඉන් 1 ගමන් මලු රු. මිලියන 10.5 කට මිලදී ගැනීම.</u>**		
i. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.2 වගන්තියට අනුව, ප්‍රසම්පාදන කාලසටහන (PTS) පිළියෙල කර නොතිබුණි.	බැංකුව විසින් ප්‍රසම්පාදනයේ වටිනාකම සහ පරිමාණය සැලකිල්ලට ගනිමින් ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොමැත.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

ii.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.9.3 වගන්තියට අනුව, රු. 500,000 ඉක්මවන භාණ්ඩ කොන්ත්‍රාත්තු සඳහා විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතුය. කෙසේ වෙතත්, මෙම ඇණවුම සඳහා එවැනි අත්සන් කළ ගිවිසුමක් නොතිබුණි.	බැංකුව විසින් ලංසුකරු සමඟ ප්‍රාථමික ගිවිසුමක් ලෙස පිළිගැනීමේ ලිපියක් අත්සන් කර ඇත. ගැටළුව නිවැරදි කිරීම සඳහා විධිවිධාන සලසනු ඇත.

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1.	2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 26 වන වගන්තියට අනුව, බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමට මණ්ඩලයට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, 2019 න් පසු පසුගිය වසර පහ සඳහා සමාලෝචනය කරන ලද ලිපි හුවමාරුවලට අනුව, පනතේ 26(4) වගන්තිය යටතේ අවශ්‍ය පරිදි, අවම වශයෙන් වසර තුනක අඛණ්ඩ කාලයක් ධුරය දැරිය හැකි ස්ථිර පදනමක් මත සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමට මණ්ඩලය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.	2025 ජූනි 05 වන දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී තනතුර නැවත ප්‍රචාරය කිරීමට උපදෙස් දී ඇත.	පනතේ විධිවිධානවලට අනුකූලව ස්ථිර සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමට කටයුතු කළ යුතුය.
2.	2024 වර්ෂය තුළදී බැංකුවේ ප්‍රධාන තොරතුරු නිලධාරී, ණය, විශේෂ ව්‍යාපෘති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ පුනර්ජීවන හා අයකර ගැනීම් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වැනි ප්‍රධාන තනතුරු පුරප්පාඩු වී තිබූ අතර වැඩබලන පදනම මත පුරවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ ප්‍රධාන අවදානම් නිලධාරී තනතුරු පුරප්පාඩු වී තිබුණි. තවද, ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර ද පුරප්පාඩු වී තිබූ අතර වැඩබලන පදනම මත පුරවා තිබුණි. ස්ථිර නායකත්වයක් නොමැතිකම ඵලදායී පාලනයකට සහ අවදානම් කළමනාකරණයට බලපෑ හැකිය. තීරණාත්මක භූමිකාවන් පිරවීමේ ප්‍රමාදයන් බැංකුවේ දිගුකාලීන ව්‍යාපාරික අරමුණු කෙරෙහි ද බලපෑ හැකිය.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	දිගුකාලීන ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සියලුම පුරප්පාඩු වූ ප්‍රධාන තනතුරු පිරවීමට කටයුතු කළ යුතුය.
3.	විගණනයේදී සමාලෝචනය කරන ලද සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරුවලට අනුව, 2024 දෙසැම්බර් 31 වන දිනට අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 565 ක් පවතින අතර එය සියලු මට්ටම්වල කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු පුරප්පාඩු නියෝජනය කරයි. මෙයට කළමනාකරු / සහකාර කළමනාකරු / නියෝජ්‍ය කළමනාකරු / කළමනාකරණ අභ්‍යාසලාභී කාණ්ඩයේ පුරප්පාඩු 194 ක් සහ බැංකු සහකාර කාණ්ඩයේ පුරප්පාඩු 318 ක් ඇතුළත් වේ. ඊට අමතරව, සීමාවාසික පුහුණුව ලබන අභ්‍යාසලාභීන් 875 ක් සිටින අතර, එය ස්ථිර රැකියා තනතුරු පිරවීමට වඩා තාවකාලික සම්පත් මත යැපීම පෙන්නුම් කරයි. සමස්ත පුරප්පාඩු මට්ටම ප්‍රමාණවත් නොවන මිනිස්බල සැලසුම්කරණය ඉස්මතු කරන අතර	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	බැංකුවේ කටයුතු සුමටව සිදු කිරීම සඳහා අවශ්‍ය පිරිස් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා සැපයීම කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය. මෙහෙයුම් වියදම්වලින් ප්‍රතිශතයක් ලෙස බැංකුවේ කාර්ය මණ්ඩල පිරිවැය 2024 දී සියයට 75.5 ක් වූ අතර එය අංශයේ සාමාන්‍යය වන සියයට 70.30 ට වඩා සැලකිය යුතු වැඩි අගයක් වේ. පවතින සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම මෙම අනුපාතය තවදුරටත් වැඩි කිරීමට ඉඩ ඇති බවත්, එය ලාභදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකි බවත් මෙහෙයුම් අලාභ පවා ඇති කළ හැකි බවත් තවදුරටත් නිරීක්ෂණය විය.		
4. 2021 ජුනි 01 දිනැති පරිපාලන චක්‍රලේඛ අංක 2021/138 හි නිශ්චිතව දක්වා ඇති සංවිධාන ව්‍යුහයට අනුව, සී ශ්‍රේණියේ ශාඛාවක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 08 දෙනෙකු වන අතර, 3-I ශ්‍රේණියේ එක් නිලධාරියෙකු, 3-II/3-III ශ්‍රේණියේ නිලධාරීන් 02 දෙනෙකු සහ 5-I ශ්‍රේණියේ සිට 5-III දක්වා නිලධාරීන් 05 දෙනෙකුගෙන් සමන්විත වේ. කෙසේ වෙතත්, ශාඛා 21 ක් අතිරික්ත කාර්ය මණ්ඩලයක් සමඟ ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය වූ අතර, ශාඛා 51 ක් නිලධාරීන් 01 සිට 03 දක්වා පුරප්පාඩු සහිතව ක්‍රියාත්මක විය. තවද, චක්‍රලේඛයට අනුව, සී ශ්‍රේණියේ ශාඛාවක ශාඛා කළමනාකරු තනතුර 3-I ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් දැරිය යුතුය. මෙම අවශ්‍යතාවයට පටහැනිව, ශාඛා 18 ක් 3-I ශ්‍රේණියේ නිලධාරියෙකු නොමැතිව ක්‍රියාත්මක වූ අතර, ශාඛා 25 ක 3-I ශ්‍රේණියේ නිලධාරීන් 01 සිට 02 දක්වා අතිරික්තයක් පැවතුනි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	බැංකු ශාඛාවල සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩලය නිසි ලෙස වෙන් කිරීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 යටතේ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 3.1 වගන්තියට අනුව, බැංකුව විසින් පාර්ලිමේන්තුවට සභාගත කිරීම සඳහා සිය වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, මෙම විධිවිධානයට පටහැනිව, විගණිත දිනය දක්වා බැංකුව විසින් 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා සිය වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොමැත.	චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට වහාම කටයුතු කිරීම.

4.2 සංයුක්ත සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1. 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද "රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ" හි 2.3 වගන්තියේ විධිවිධානවලට අනුව, ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ එහි නියම කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයේ උපායමාර්ගික සැලැස්ම පිළියෙල කර ඇති බව සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි. ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම, අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අදාළ වන පරිදි, ඉදිරි වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව තවමත් උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කර නොමැති අතර එමගින් මෙම විධිවිධානයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි.	උපායමාර්ගික සැලසුම්කරණය බැංකුවේ තීරණාත්මක ක්‍රියාවලිය වන අතර, 2024 මූල්‍ය වර්ෂයේ මැද භාගයේ සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ අවබෝධය සමඟ 2024 සඳහා උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීම ආරම්භ කර ඇත. කෙසේ වෙතත්, ක්‍රියාවලියේ සංකීර්ණත්වය සහ සමාලෝචනය හේතුවෙන් ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වී ඇති අතර, එය 2025-2029 සඳහා උපායමාර්ගික සැලැස්මක් ලෙස අවසන් කර ඇත. සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අදාළ රේඛීය අමාත්‍යාංශයට යවා ඇත.	මාර්ගෝපදේශ යේ 2.3 වගන්තියට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
2. උපායමාර්ගික සැලැස්මක් වෙනුවට, බැංකුව විසින් චක්‍රීය තුන් අවුරුදු සංයුක්ත සැලැස්මක් සකස් කර ඇත. මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලසුම් 2022–2024 සහ 2023–2025 කාල පරිච්ඡේද සඳහා ලබා ගත හැකි වුවද, 2024-2026 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොමැති බැවින් 2024 – 2026 කාල පරිච්ඡේද සඳහා කිසිදු සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම පාර්ශවකරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් සහතික කරන අතර, උපායමාර්ගික සැලැස්මක්, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සහ වාර්ෂික අයවැයක් රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමෙන් නියමිත කාල සීමාවට අනුකූල වීමට බැංකුව පියවර ගෙන ඇත. ඇතැම් තත්වයන් යටතේ, පාලනය කළ නොහැකි සාධක හේතුවෙන් බැංකුවට නියාමන අවශ්‍යතාවලට අනුකූල වීමට නොහැකි විය.	

4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1. සමාලෝචිත වර්ෂය ආරම්භ වීමට පෙර ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අනුමත කිරීමට බැංකුව අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. මූල්‍ය වර්ෂයෙන් අඩක් පමණ ගතවීමෙන් පසු, 2024 මැයි 14 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික සැලැස්ම අනුමත කර තිබුණි. තවද, වර්ෂයේ මුල් මාස හතර තුළ බැංකුව අලාභ ලබන තත්ත්වයකට පත්වී ඇති බව නිරීක්ෂණය විය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට පෙර පිළියෙල කිරීමට සහ සමාලෝචනය කිරීමට සැලකිය යුතු කාලයක් ගත වේ. කෙසේ වෙතත්, එහි ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් සෑම දෙපාර්තමේන්තුවක්ම එහි ඉලක්ක/කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට පෙළඹවා ඇති අතර, රටේ ආර්ථික දැක්ම සැලකිල්ලට ගනිමින් මෙහෙයුම් කාර්යක්ෂමතාවයට සෘණාත්මක බලපෑම් වළක්වා ගැනීමට තීරණ ගෙන ඇත.	සෑම මූල්‍ය වර්ෂයක්ම ආරම්භ වීමට පෙර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර, සමාලෝචනය කර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බවට සහතික වීම.
2. "රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය" හි 2(ඒ) ඡේදයට සහ ඒ මගින් සපයන ලද ආදර්ශය අනුව, ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකම සඳහා මූල්‍ය ඇස්තමේන්තු සහ කාල ඉලක්ක මාසවලින් නිශ්චිතව දක්වා තිබිය යුතුය. කෙසේ වෙතත්, බැංකුව විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මෙම අවශ්‍යතා සපුරා නොතිබුණි.	බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවලට අදාළ මූල්‍ය හා මූල්‍ය නොවන අංශවල සියලු අංශ ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇත. එබැවින්, සියලුම ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ඇස්තමේන්තු සියලු ක්‍රියාකාරකම් සඳහා විශ්වාසදායක ලෙස මැනිය නොහැක.	අදාළ මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

4.4 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
බැංකුවේ වාර්ෂික අයවැය විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරන ලදි.		
1. "රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය" හි 02 වන පරිච්ඡේදයේ 2.3 වගන්තියේ විධිවිධානවලට පටහැනිව, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය බැංකුව විසින් පිළියෙල කර නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අයවැයේ	බැංකුව මේ දක්වා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කර නොමැති අතර, අනාගතයේදී එය පිළියෙල	මාර්ගෝපදේශයට අනුකූල වීමට කටයුතු කළ යුතුය.

	ප්‍රධාන ලේඛීය අයිතම ලාභ අලාභ ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සමඟ අනුරූප නොවේ.	කර ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ඇත. අවසාන ගිණුම්වල සහ MIS වාර්තාකරණයේ ව්‍යුහය ස්වභාවයෙන් සහ අරමුණෙන් වෙනස් වන බැවින්, ලේඛීය අයිතමවල ඇතැම් වෙනස්කම් නොවැළැක්විය හැකිය.	
2.	2024 වර්ෂය සඳහා දළ ආදායම, පොලී ආදායම, පොලී වියදම, ගාස්තු සහ කොමිස් වියදම්, ණය අලාභ සඳහා ප්‍රතිපාදන, අනෙකුත් පොදු කාර්ය වියදම් සහ බදු සඳහා සත්‍ය සංඛ්‍යාලේඛන, අයවැයගත මුදලින් සැලකිය යුතු ලෙස අපගමනය වී ඇති බව නිරීක්ෂණය වූ අතර විචලනයන් සියයට 18 සිට සියයට 192 දක්වා පරාසයක පැවතුනි.	ඇතැම් ලේඛීය අයිතම සඳහා අයවැයගත කර ඇති සහ සත්‍ය සංඛ්‍යාලේඛන අතර නිරීක්ෂණය කරන ලද අපගමනයන් බැංකුව පිළිගනී. කෙසේ වෙතත්, මෙම විචලනයන් ප්‍රධාන වශයෙන් පොලී අනුපාත චලනයන්, හානිකරණ ගණනය කිරීමේ ක්‍රමවේදයේ ගැලපීම් සහ පිරිවැය පාලන පියවර වැනි බාහිර තත්වයන්හි වෙනස්කම් නිසා ඇති වූ බව අවධාරණය කෙරේ. ලේඛීය අයිතම මට්ටමින් මෙම අපගමනයන් තිබියදීත්, අයවැයගත කර ඇති රු. බිලියන 1.29 ට සාපේක්ෂව බැංකුව විසින් රු. බිලියන 1.28 ක සමස්ත ලාභයක් අත්කර ගත් අතර එය සැලකිය යුතු නොවන සියයට 1 ක විචලනයක් පමණක් පිළිබිඹු කරයි.	අයවැය යථාර්ථවාදී බවත්, බැංකුවේ මෙහෙයුම් කාර්ය සාධනය සමඟ පෙළගැසී ඇති බවත්, නිවැරදි උපකල්පන මගින් සහාය දක්වන බවත් සහතික කිරීම සඳහා අයවැයකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ ශක්තිමත් කිරීම.
3.	2024 දෙසැම්බර් 31 වන දිනට මුදල් සහ කෙටිකාලීන අරමුදල්, අනෙකුත් වත්කම්, දේපළ, පිරියත හා උපකරණ, ප්‍රතිමූල්‍යකරණය, ණය ගැනීම්, අනෙකුත් වගකීම් සහ සංචිත සඳහා සත්‍ය සංඛ්‍යාලේඛන අයවැයගත මුදලින් සැලකිය යුතු ලෙස අපගමනය වී ඇති බව නිරීක්ෂණය වූ අතර විචලනයන් සියයට 17 සිට සියයට 63 දක්වා පරාසයක පැවතුනි.		
4.	අයවැය ක්‍රියාවලිය යථාර්ථවාදී නොවූ බව හෝ බැංකුවේ මෙහෙයුම් කාර්ය සාධනය සමඟ ප්‍රමාණවත් ලෙස පෙළගැසී නොමැති බව මෙම සැලකිය යුතු අපගමනයන් මගින් පෙන්නුම් කරන අතර, අයවැය පුරෝකථනවල නිරවද්‍යතාව, මූල්‍ය සැලසුම්කරණයේ ඵලදායීතාවය සහ අනුමත මූල්‍ය සැලැස්මට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා තිබිය යුතු අධීක්ෂණ යාන්ත්‍රණවල ප්‍රමාණවත් බව පිළිබඳව සැලකිල්ලට ලක් විය යුතු කරුණු මතු කළ හැකිය.		